# සීමාසහිත ලංකා නැව් සංස්ථාව

(1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා සහ රජය සතු ව්‍යාපාරික ආයතන
රජයේ සමාගම් බවට පත් කිරීමේ පනත යටතේ
1992/06/01 වන දින සිට සමාගමක් බවට පරිවර්තන කර ඇත.)

# වාර්ෂික වාර්තාව
# 2017/2018





**ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රවාහකයා**

# සී.ස.ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්
# 2017/2018


| | පිටු අංකය |
|---|---|
| පටුන | 1 |
| පිළිගැන්වීමේ ලිපිය | 2 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 3-5 |
| කළමණාකරණ කණ්ඩායම | 6-7 |
| සභාපතිවරයාගේ සමාලෝචනය | 8-14 |
| අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 15-16 |
| විගණන කමිටුවේ වාර්තාව | 17-21 |
| තුති ප්‍රණාමය කාර්ය මණ්ඩලයට ස්තුතිය | 22 |
| ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව | 23-29 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 30 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 31-32 |
| කොටස් ආයෝජන වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | 33 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 34-35 |
| මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් | 36-72 |

## සී.ස. ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්
## 2017/2018

**<u>පිළිගැන්වීමේ ලිපිය</u>**

ගරු වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා,
වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය,
අංක 19, චෛත්‍ය පාර,
කොළඹ 01.

අමාත්‍යතුමනි,

රාජ්‍ය සංස්ථා සහ රජය සතු සමාගම් රාජ්‍ය සමාගම් බවට පරිවර්තනය කිරීම සඳහා වූ 1987 අංක 23 දරන සහ 2017 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව 2017.04.01 දින සිට 2018.03.31 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ සමාගමේ ක්‍රියාකාරකම් පිළිබඳ සම්පාදිත වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශය මෙයින් ඉදිරිපත් කරමි.

මීට
විශ්වාසී,

ඩබ්ලිව්.එස්.වීරමන්
සභාපති

සී.ස. ලංකා නැව් සංස්ථාව
අංක 27, යෝනක ඉස්ලාමීය සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ල
ශ්‍රීමත් රසික් ෆරීඩ් මාවත
කොළඹ 01
2020.06.24

# ශ්‍රී.ස. ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්
# 2017/2018

## අධ්‍යක්ෂ මණ්ඩලය

2017.04.01 සිට 2018.03.31 දක්වා

සෂී ධනතුංග මහතා,
සභාපති
2015.11.09 දින සිට 2017.06.15 දක්වා

රංජිත් අතුකෝරල මහතා
විධායක අධ්‍යක්ෂ - 2017.06.02 සිට 2017.06.26 දක්වා
සභාපති 2017.06.27 සිට 2019.03.01 දක්වා

ආචාර්ය. මාලික ද සිල්වා ගුණසේකර
විධායක අධ්‍යක්ෂ - 2015.11.09 සිට 2017.05.19 දක්වා

බුද්ධික රුවන් මඩිහහේවා මහතා
අධ්‍යක්ෂ 2017.06.02 සිට 2017.06.26 දක්වා
විධායක අධ්‍යක්ෂ - 2017.06.27 සිට 2019.01.29 දක්වා

ඒ.කේ. සෙනෙවිරත්න මහතා
අධ්‍යක්ෂක/ භාණ්ඩාගාර නියෝජිත
2015.11.23 දින සිට 2019.02.21 දක්වා

ටී.එස්. නානායක්කාර මහතා
අධ්‍යක්ෂ
2015.11.09 සිට අද දක්වා - 2017.05.30

සුරේන් ගුණවර්ධන මහතා
අධ්‍යක්ෂ
2015.11.09 සිට 2017.05.29 දක්වා

මනීෂා කන්නන්ගර මිය
අධ්‍යක්ෂිකා
2015.11.09 සිට 2017.06.01 දක්වා

ආචාර්ය එම්.පරාක්‍රම දිසානායක මහතා
අධ්‍යක්ෂ
2017.06.02 සිට 2019.01.01 දක්වා

එන්.පූර්ණ පෙරේරා මහතා
අධ්‍යක්ෂ
2017.06.02 සිට 2019.02.21 දක්වා

එල්.සී.නිශාන්ත විතානගේ මහතා
අධ්‍යක්ෂක
2017.06.02 සිට 2019.02.21 දක්වා

ඒ.කේ.ජානක නන්ද කුමාර මහතා
අධ්‍යක්ෂක
2017.06.02 සිට 2018.07.10 දක්වා

**අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්**
ඊ.එම්.එස් පෙරේරා මහත්මිය (2017.08.10 දක්වා)
(නීතිඥ, වරාය කළමනාකරණය සහ නැව් කටයුතු හා ප්‍රවාහණ කළමනාකරණය පිළිබඳ පශ්වත් උපාධි ඩිප්ලෝමාධාරී නෙර්දලන්තය)

එම්.ගුණසේකර මහත්මිය (14.11.2017 සිට අද දක්වා)
සමාගම් ලේකම් (Accs හි ආශ්‍රිත සාමාජික)
කම්කරු සබඳතා සහ මානව සම්පත් කළමණාකරණය පිළිබඳ පශ්වාත් ඩිප්ලෝමාධාරී - කොළඹ විශ්ව විද්‍යාලය

**බැංකුකරුවන්**
මහජන බැංකුව- ආයතනික බැංකු අංශය
ලංකා බැංකුව
කොමර්ෂල්බැංකුව පීඑල්සී

**විගණකවරු**
විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව, පොල්දූව පාර, බත්තරමුල්ල.

**අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම**
සමාලෝචිත වර්ෂය තුලදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම 09 ක් පවත්වන ලදී.

**ලියාපදිංචි කාර්යාලය**
සී/ස ලංකා නැව් සංස්ථාව
අංක 27, යෝනක ඉස්ලාමීය සංස්කෘතික ගොඩනැගිල්ල
රසීක් ෆරිඩ් මාවත
කොළඹ 01
ශ්‍රී ලංකාව
දුරකථනය +94 112328772 /3 ෆැක්ස් +94112449486
විද්‍යුත් කැපැල cscl@cscl.lk
වෙබ් අඩවිය www.cscl.lk

## සී.ස. ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම්
## 2017/2018

<u>කළමනාකරණ කණ්ඩායම</u>

සමානාධිකාරී
එස්.එම්.ඩී.එන් ධර්මප්‍රිය මහතා
විද්‍යාවේදී, සාගර අධ්‍යන විද්‍යාපති (එක්සත් රාජධානිය) එම්. අයි.එල්.ටී.-එංගලන්තය

නියෝජ්‍ය සමානාධිකාරී
නෛතික හා රක්ෂණ/මානව සම්පත්
ඊ.එම්.එස් පෙරේරා මහත්මිය ( නීතිවේදී)
(වරාය, නාවික හා ප්‍රවාහන කටයුතු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරී නෙදර්ලන්තය)

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වෙළඳ)
සී. ජයසිංහ මහත්මිය එෆ්.අයි.සී.එස්, එම්.අයි.එල්.ටී - එක්සත් රාජධානිය
විද්‍යාපති - (ජාත්‍යන්තර නාවිත කටයුතු) - එක්සත් රාජධානිය
නාවික කටයුතු පිළිබඳ ඩිප්ලෝමාධාරී (ඔස්ලෝ)

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - (තාක්ෂණික)
එස්.එල් රාජපක්ෂ මහතා - යාන්ත්‍රික ඉංජිනේරු උපාධිධාරී
ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආයතනික සාමාජික සහ වරලත් ඉංජිනේරු වශයෙන් ලියාපදිංචි වී ඇත.

සහකාර සමානාධිකාරී (මූල්‍ය)
ජී.එම්. විකුම් ප්‍රදීප මහතා
වාණිජ විද්‍යාවේදී ( විශේෂ) ගෞරව, එල්.අයි.සී.ඒ
නාවික කටයුතු කළමනාකරණ විද්‍යාපති (මැල්මෝ-ස්වීඩන්)

සහකාර සාමාන්‍යාධිකාරී - (නෛතික හා රක්ෂණ)
පී. සමරනායක මහතා
නීතිවේදී
විද්‍යාවේදී (විශේෂ)

සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාපාර සංවර්ධන)
වයි.වෙත්තසිංහ මහත්මිය
විද්‍යාවේදී (සාමාන්‍ය)
නාවික විද්‍යාපති -ඩබ්ලිව්.එම්.යූ (මැල්මෝ-ස්වීඩන්)

අභ්‍යන්තර විගණක
වයි.පොන්නම්පෙරුම මහතා
එල්.අයි.සී.ඒ.එෆ්එම් ඒඒටී
නාවික කළමනාකරණ පිළිබඳ පශ්චාත් උපාධිධාරී (ඔස්ලෝ)

එතෙර සඳහා පත්කළ නිලධාරී
කැප්ටන් නිෂ් විජයකුලතිලක මහතා
Master Mariner, MBA (Col), CMILT, AFNI(UK)
IMO Maritime Ambassador, UNA සාමාජික

නැව් කුලියට දීම සහ ඒජන්සි සේවා කළමණාකරු
අයි.දන්තනාරායන මහතා
විද්‍යාවේදී රාජ්‍ය කළමනාකරණ (විශේෂ) ගෞරව - නාවික කටයුතු පිළිබඳ විද්‍යාපති (මැල්මෝ - ස්විඩන්)
එම්.අයි.එල්.ටී.එක්සත් රාජධානිය - එල්.අයි.සී.ඒ

කළමනාකරු (ප්‍රාලේඛණ)
කේ.එල්.එම්.මධුරාජා මහතා
වාණිජ විද්‍යාවේදී (විශේෂ) ගෞරව උපාධිය
නාවික විද්‍යාපති - WMU (මැල්මෝ-ස්වීඩන්)

කළමනාකරු (නැව්, භාණ්ඩ හා සේවා සම්පාදන, NVOCC)
එන්.පී.කල්පගේ මහතා
ශාස්ත්‍රවේදී (විශේෂ)
නාවික විද්‍යාපති - WMU (මැල්මෝ-ස්වීඩන්)

කළමනාකරු (මානව සම්පත්)
ටී.එල්.නැලිගම මහත්මිය (2017.09.26 දින විශ්‍රාම ලැබීය)
භාණ්ඩ හා සේවා සම්පාදන හා ප්‍රවාහන පිළිබඳ ජාත්‍යන්තර උසස් ඩිල්ලෝමාව (එක්සත් රාජධානිය) MILT
වෘත්තිය නාවික කටයුතු පිළිබඳ ඩිප්ලෝමාධාරී (ශ්‍රී ලංකාව)

කළමනාකරු (මූල්‍ය)
ඩබ්.ඒ.ඩී.එස්.විජේසිංහ මහතා
ගිණුම්කරණ පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාධාරී, LICA
වරාය, නාවික හා ප්‍රවාහන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරී (OSLO)

කළමනාකරු (මානව සම්පත්) - රාජකාරි ආවරණය කිරීම
එම්.ගුණසේකර මහත්මිය (2017.10.09 සිට අද දක්වා)
සමාගම් ලේකම් - Accs හි ආශ්‍රිත සාමාජික කම්කරු සබඳතා හා මානව සම්පත් කළමණාකරණ පිළිබඳ
පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරී - කොළඹ විශ්ව විද්‍යාලය)

කළමණාකරණ ප්‍රධානි
එම්.ආර්.එල්.පී.පී. ගුණරත්න මහතා
කළමණාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරී - විවෘත විශ්ව විද්‍යාලය
ව්‍යාපාරික තොරතුරු ඩිප්ලෝමාධාරී
නාවික පුහුණු වැඩසටහන් පාඨමාලාව - CSCL

# සී/ස ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් - 2017/2018

## සභාපතිවරයාගේ සමාලෝචනය

1. **ලංකා නැව් සංස්ථාවේ කෙරෙමින් පවතින මෙහෙයුම් කටයුතු**

නැව් හිමිකරුවෙක්, මෙහෙයුම්කරුවෙක් නෞකාමය නොවන පොදු ප්‍රවාහකයෙක්, නාවික නියෝජිතයෙක් සහ සමස්ත භාණ්ඩ හා සේවා සම්පාදකයෙක් වශයෙන් ශ්‍රී ලංකා නැව් සංස්ථාව සාර්ථක අයුරින් තම ව්‍යාපාරික කටයුතුවල නියැලෙමින් සිටි.

2. **මෙහෙයුම් කටයුතුවල නැව් යෙදැවීම**

ලංකා නැව් සංස්ථාව සතු සීලොන් බ්‍රීස් සහ සිලෝන් ප්‍රින්සස් යන නෞකා දෙක පුත්තලමේ පිහිටි ලක්විජය තාප බලාගාරයට ගල් අඟුරු ප්‍රවාහණය කිරීම පිණිස යොදවන ලදී. 2017/2018 වර්ෂය තුළදි මෙම නැව් දෙක යාත්‍රාගමන් 10 ක නිරත වෙමින් ගල්අඟුරු ටොන් මිලියන 0.611 ක් ප්‍රවාහණය කිරීමේ කටයුතුවල යෙදුණි.

එකී මෝසම් කාලය තුළ (2017 අප්‍රේල් මස සහ අගෝස්තු මැද දක්වා) මෙම නැව් දෙක, විවෘත වෙළඳපොළේ කටයුතු නියැලිය හැකි සීමිත කාලය සැලකිල්ලට ගනිමින් විනිවිද භාවයෙන් යුක්තව තරඟකාරි ටෙන්ඩර් පරිපාටියක් හරහා තෝරාගත් සහ සිංගප්පූරුවේ සිටින සුප්‍රකට වාණිජ කළමණාකරුවෙකු යටතේ සාර්ථක ලෙස, ජාත්‍යන්තර නැව් කුලී වෙළඳපොළේ (Charter Market) මෙහෙයුම් කටයුතුවල යොදවන ලදී. තවද, ඉදිරි සෘතුව සඳහා "ලක්විජය" තාප බලාගාරය සඳහා ගල් අඟුරු ප්‍රවාහනය පිණිස නැවත මෙහි ගෙන්වා ගැනීමේ අරමුණු ඇතිව මෙම නැව් දෙක කුලී ගමන් හා කුලී යාත්‍රා ගමන් (Voyage Charters) පදනමින් මෙහෙයුම් කටයුතුවල යොදවන ලදී. සීලොන් බ්‍රීස් හා සිලෝන් ප්‍රින්සස් යන නෞකා දෙක, සමාලෝචිත මූල්‍ය වර්ෂයේදී භාවිතයට ගැනීමේ ප්‍රතිශතය පිළිවෙලින් 96% ක් සහ 95% ක් වේ.

3. **වියලි තොග ප්‍රවාහණ වෙළඳ පොළ**

වියළි තොග නාවික යාත්‍රා අංශය (dry bulk fleet sector) සම්බන්ධයෙන් ගත්කළ 2016 වර්ෂය අභියෝගාත්මක වූයේ අනවරත අයුරින් එය අධි-ධාරිතාව පිළිබඳව ගැටළු මෙන්ම ඉල්ලුම පිළිබඳ අඩු වර්ධනයක් නොකඩවා පෙන්නුම් කළ හෙයිනි.

2016 දී ලොව පුරා ඇති වූ ආර්ථික අවපාතයෙන් ඉක්බිතිව ගෝලීය නාවික තොග ප්‍රවාහණ වෙළඳපොළ ක්‍රමක්‍රමයෙන් වැඩිදියුණු විය. 2017/18 වර්ෂය තුල වෙළඳ සේවා, බෝල්ටික් වියලි

දර්ශකය (BDI) 1366 ලක්ෂායේ නැවතුණු අතර එම තත්ත්වය 2016/17 වර්ෂය හා සසඳන කළ 961 ක සිත්ගන්නා තරමේ වැඩිවීමක් විය.

2017 ජූලි මාසයේ සිට බොහෝ විට සියලු ආකාරයේ වියලි තොග මුහුදින් ප්‍රවාහණය කිරීමේ පිරිවැය වැඩි වූ අතර සමාලෝචනයට අදාළ මූල්‍ය වර්ෂයද ඇතුළුව පසුගිය අවුරුදු 4 පුරා බෝල්ටික් වියළි දර්ශකය වර්ධනය විය. පහත දැක්වෙන සටහන්වලින් එය දක්වා ඇත. සාමාන්‍ය වියලි තොග වෙළඳපොල රටාව අනුව දෙසැම්බර් සිට මාර්තු දක්වා දර්ශක අනුපාත පහත වැටෙන අතර වර්ෂයේ දෙවන කාර්තුවේ සිට ඉහල යාමට පටන් ගනී.

2003 වර්ෂය ආරම්භයේ සිට 2016 දෙසැම්බර් දක්වා කාලය තුළ බෝල්ටික් වියලි දර්ශකයේ එදිනෙදා වාර්තාවක් පහතින් දැක්වේ.

**බෝල්ටික් වියලි දර්ශකය - 2003 සිට මේ දක්වා**




4. <u>ප්‍රධාන ව්‍යාපාරික අංශ</u>
   <u>ගල් අඟුරු ප්‍රවාහණය හා ගොඩබෑම</u>

සමාලෝචනයට අදාළ මූල්‍ය වර්ෂය තුළදී සමාගම සතු නාවික යාත්‍රාමගින් ගල් අඟුරු මෙ.ටො.මිලියන 0.611 ක් සී/ස ලංකා ගල්අඟුරු සමාගමට/ ලංකා විදුලිබල මණ්ඩලයට ප්‍රවාහනය කරන ලද අතර එයින් රු.මිලියන 1031.60 ක ආදායමක් උපයා ගන්නා ලදී.

ගොඩබෑම් පිළිබඳ මෙහෙයුම් කටයුතුවලට අදාළ ඇමතුම් කොමිස්වලින් (address commission of lightering operations) ලබාගන්නා ශුද්ධ ලාභය 50:50 පදනම යටතේ ලංකා නැව් සංස්ථාව සහ ලංකා විදුලිබල මණ්ඩලය අතරේ බෙදා ගැනීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල තීරණය, ගල්අඟුරු මෙහෙයුම් කටයුතුවලින් සමාගම විසින් අදාළ මූල්‍ය වර්ෂයේදී ලැබූ ලාභය පහත වැටීමට හේතු වූ කරුණක් විය.

මේ හේතුව නිසා ඒජන්සි හා ඇමතුම් කොමිස් මුදල්වලින් 2016/2017 වර්ෂයේදී ලැබූ ආදායම වන රු.මිලියන 556.32 හා සසඳන කළ 2017/2018 වර්ෂයේ ලැබූ ආදායම ලෙස රු.මිලියන 467.46 දක්වා වූ අඩු අගයක් පෙන්නුම් කළේය.

**ගල් අඟුරු ප්‍රවාහනය පිළිබඳ භෞතික කාර්ය සාධනය 2016/2017 සහ 2017/2018**




5. <u>මූල්‍ය සමාලෝචනය</u>

2017/18 වර්ෂය තුළදි ලංකා නැව් සංස්ථාව විසින් ලබාගත් මුළු ආදායම රුපියල් මිලියන 2499.47 ක් විය. පසුගිය මූල්‍ය වර්ෂය හා සසඳන කළ එය අවුරුදු පතා සිදුවූ 1.64% ක පහත වැටීමකි. කෙසේ නමුත් සෘජු මෙහෙයුම් වියදම් 4.07% කින් එනම් රු.මිලියන 1600.43 සිට රු.මිලියන 1665.63 දක්වා වැඩිවිය.තවද දළ ලාභය 11.34% කින් එනම් රු.මිලියන 940.56 සිට රු.මිලියන 833.83 දක්වා අඩු විය. අවසාන වශයෙන් ගත්කළ මෙහෙයුම්වලින් ලැබූ ලාභයද 6.9% කින් එනම් රු.මිලියන 871.42 සිට රු.මිලියන 811.22 දක්වා අඩුවිය.

මීට අමතරව සංස්ථාව සතු නැව් දෙකෙන් නැව් බඩු ප්‍රවාහනය කිරීම හා ඒවා කුලීයට දීමෙන් උපයා ගන්නා ලද ආදායම රු.මිලියන 1513.67 සිට රු.මිලියන 1534.17 දක්වා වූ 1.35% ක සුළු වැඩිවීමක් සමාලෝචනයට අදාළ මූල්‍ය වර්ෂය තුළදී පෙන්නුම් කළේය. එක්සත් ජනපද ඩොලරයට අනුව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම, සමාගම කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය. 2017 අප්‍රේල් මස 01 දින සිට 2018 මාර්තු 31 දිනට අවප්‍රමාණය වූ ප්‍රතිශතය 2.33% කි. ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතින් අනුව අනිවාර්ය ලෙස අදාළ මූල්‍ය වර්ෂයේදී ගෙවිය යුතුවූ, ප්‍රත්‍යාගණනය කළ යාත්‍රා ණය වශයෙන් පැවති රු.මිලියන 294.31 ක විණිමය පාඩුව වැඩි වීම කෙරෙහි එයින් සෘජු ලෙස බලපෑමක් ඇති විය.

කෙසේ නමුත්, ඉහත කී මූල්‍ය වර්ෂයේදී නැව් තැනීම සඳහා ලබා ණය වෙනුවෙන් වූ මුළු පොලී වාරිකය සහ ප්‍රාග්ධන වාරිකයේ කොටසක් වශයෙන් පිළිවෙලින් රු.767,082,249 ක් සහ රු.234,720,000 (එ.ජ ඩොලර් මිලියන 1.8 ක්) ගෙවීමට ලංකා නැව් සංස්ථාවට හැකිවිය.

තවද, කැපී පෙනෙන විණිමය පාඩුව හා ණය පොලී ගෙවීම හේතුකොට ගෙන රු.175,556,501 ක පාඩුවක් වාර්තා විය. එහෙත් පසුගිය වර්ෂයේ සිදුවූ පාඩුව වන රු.237,010,652 අනුව සසඳා බලන කළ, තත් වර්ෂයේදී එකී පාඩුව අඩුකර ගැනීමට ලංකා නැව් සංස්ථාවට හැකිවිය. කෙසේ නමුත් මෙයින් සමාගමේ ශුද්ධ වටිනාකම කෙරෙහි ඉතා අහිතකර ලෙස බලපෑමක් ඇතිවිය.

**මාර්තු 31 දිනෙන් අවසන් වූ පසුගිය වර්ෂ 06 සඳහා ආදායම් බද්දෙන් පසු ලාභය (PAT)**



මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම




මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙනත්ආදායම්ඇතුළුආංශිකආදායම




6. <u>නෞකාමය නොවන පොදු ප්‍රවාහන මෙහෙයුම් (NVOCC) සේවා</u>

2017/2018 මූල්‍ය වර්ෂයට අදාළ කාලය තුළදී අංක 415 දරන චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය අංශයේ සියළු නාවික භාණ්ඩ ආනයනය කළ යුතුය යන නියමයට අනුව ලෝකයේ සියළු රටවල් වෙතින් ඉඩකුලී හා යාත්‍රා ගමන් කුලී පදනම මත තුන්වන පාර්ශවයේ නැව් වලින් ලංකා නැව් සංස්ථාව විසින් බහාළුම් ගත නාවික භාණ්ඩ, වාහන, විසිරි තොග අධිබර නාවික භාණ්ඩ වැනි සාමාන්‍ය නාවික භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ කටයුතුවල ලංකා නැව් සංස්ථාව නොකඩවා නිරත විය. එහෙත් විවිධ හේතූන් මත එනම් නාවික භාණ්ඩවල ස්වභාවය, ඒවා කඩිනමින් ප්‍රවාහණය කිරීමේ අවශ්‍යතාවය, සැපයුම්කරුවන්ගේ විශේෂ කොන්දේසි, අමාත්‍ය මණ්ඩලයෙන් විශේෂ අනුමැතීන් ලබාගත යුතු වීම සහ නැව්ගත කරන්නාගේ අභිමතය පරිදි ඒ වනවිටත් නාවික භාණ්ඩ නැව්ගත කොට තිබීම වැනි විවිධ තරුණු

හේතුකොට ගෙන ඇතැම් රාජ්‍ය ව්‍යවසායකයන් විසින් රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 415 ට අනුකූලව කටයුතු නොකළ අතර එකී හේතූන් මත සංස්ථාවට ආදායම අහිමි වුයෙන් CIF හෝ CFR පදනම මත භාණ්ඩ තොග ආනයනය කිරීම සඳහා විදේශ විණිමය වැය කිරීමට රජයට සිදුවිය.

පසුගිය වර්ෂයේදී නෞකාමය නොවන භාණ්ඩ ප්‍රවාහණ සේවා කටයුතුවලින් ලත් රු.මිලියන 244 ට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂය තුළදී එම ආදායමෙහි වර්ධනයක් පෙන්නුම් කෙරෙමින් සංස්ථාව විසින් ආසන්න වශයෙන් රු.මිලියන 359 ක ආදායමක් උපයා ගන්නා ලදී.

නෞකාමය නොවන පොදු ප්‍රවාහන (NVOCC) හා භාණ්ඩ සේවා සැලයීමේ කටයුතුවල භෞතික කාර්යසාධනය පහත දැක්වෙන රූප සටහන් වලින් පෙන්නුම් කෙරේ.







2016/2017 මූල්‍ය වර්ෂයට සාපේක්ෂ වශයෙන් 2017/2018 වර්ෂයේ නෞකාමය නොවන පොදු ප්‍රවාහන (NVOCC) හා භාණ්ඩ හා සේවා සැපයීම් කටයුතුවල ප්‍රගතිය මැන බැලීමේදී සංස්ථාව විසින් අනුගමනය කළ දැඩි වෙළඳපොළ ප්‍රවේශයන්, බොහෝ දැනුවත් කිරීමේ වැඩසටහන් මෙන්ම අලෙවි ප්‍රයත්නයන් ආදියෙහි ප්‍රතිඵලයක් ලෙස සම්පූර්ණ බහාළුම් තොග වශයෙන් නාවික භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ කටයුතුවල 43.82% ක වර්ධනයක් ඇතිවිය.

ඉහත මූල්‍ය වර්ෂය හා සසඳන කළ රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් නාවික භාණ්ඩ නැව්ගත කිරීම් පිරිසැකසුම් කිරීම සහ භාණ්ඩ හා සේවා සම්පාදන කටයුතු හා නිෂ්කාෂණ සේවාවන්හි සුළු වර්ධනයක් ඇති විය.

7. <u>මානව සම්පත් සංවර්ධනය</u>

ලංකා නැව් සංස්ථාවේ සේවකයින් 06 දෙනෙක් විශ්‍රාමගිය අතර අළුතින් සේවකයින් 04 දෙනෙක් බඳවා ගන්නා ලදී. වැටුප් හා ඒවාට අදාළ වියදම් රු.15,016,182.25 කින් 2017/2018 දී වැඩි වූ අතර 2016/2017 වර්ෂයේ වියදම්වලට සාපෙක්ෂව එය 18.1% ක වැඩිවීමකි.

රු.734,305.00 ක පිරිවැයක් දරමින් සේවකයන් 55 දෙනෙකුට පුහුණු වීම් අවස්ථා ලබා දෙන ලදි. පුහුණුවීම් වෙනුවෙන් ඇස්තමේන්තු කල වියදම රු.මිලියන 2ක් වූ අතර එය 37%ක ප්‍රතිශතයකි.

8. <u>සුභසාධක කටයුතු</u>

සී/ස ලංකා නැව් සංස්ථාවේ සුභසාධක හා විනෝද ක්‍රීඩා සමිතිය සංස්ථාවේ පාලනාධිකාරිය හා නිලධාරි මණ්ඩලයේ සහාය ඇතිව තම කටයුතු නොකඩවා පවත්වා ගෙන යමින් සිටි.

## සමාගමේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව
## 2017/2018

2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වාර්ෂික මහා සභා රැස්වීමේදී ඉදිරිපත් කරනු පිණිස විගණනය කරන ලද තම ගිණුම් සහිත වාර්තාව ලංකා නැව් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රීතියෙන් ඉදිරිපත් කර සිටී.

### වර්ෂයේ සමාලෝචනය

පිටු අංක 08 සිට 14 දක්වා සභාපතිගේ සමාලෝචනය යටතේ විස්තර කොට දැක්වෙන්නේ ප්‍රවර්තන මූල්‍ය වර්ෂ තුළ සහ මෙම වාර්තාවේ දිනට, මුහුණදීමට තිබෙන ඉදිරි අභියෝගයන්ය. මෙම වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන තුලින් පිළිඹිබු වන්නේ සමාගමේ කටයුතු වල තත්ත්වයයි.

### ප්‍රධාන ක්‍රියාකාරකම්/ ප්‍රධාන ව්‍යාපාරික කටයුතු

සමාගමේ ප්‍රධාන කටයුතු වන්නේ නැව් බඩු මුහුදු මගින් ප්‍රවාහනය කිරීම, ඒ ඒ ස්ථාන දක්වා ඒවා බෙදාහැරීම, නැව් බඩු ප්‍රවාහනය සඳහා රැස් කිරීම, ශ්‍රී ලංකික තානාපති කාර්ය මණ්ඩලයන් හී ගෘහස්ත හා පෞද්ගලික බඩු බාහිරාදිය එක් එක් රටවල් කරා ගෙන යාම, නියෝජ්‍ය ආයතනයක් ලෙස රේගු කටයුතු කිරීම, නාවික නියෝජිත ආයතන සේවා, නැව් හිමියන්, කළමණාකරුවන් හා මෙහෙයුම් කරුවන්, නැව් කුලියට දෙන තැනැත්තන් ලෙස කටයුතු කිරීම වේ.

ලංකා නැව් සංස්ථාව සියලු ආකාරයේ බහලුම් ගත ද්‍රව්‍ය, ගල් අඟුරු, විසිරි තොග, ගල් අගුරු තොග, වාහන, ව්‍යාපෘති සඳහා වූ නැව් බඩු හා බරැති නාවික භාණ්ඩ ආදිය වැනි ප්‍රවාහනය කිරීමේ නිරත වේ.

### මූල්‍ය ප්‍රකාශ

2007 අංක 07 දරණ සමාගම් පණතේ 151 වගන්තියේ නියමයන් ප්‍රකාරව පිළියෙල කරන ලද වාර්ෂික වාර්තාවේ පිටු අංක 30 සිට 72 දක්වා වූ පිටුවල මූල්‍ය ප්‍රකාශ දැක්වේ.

### ස්වාධීන විගණනකරුවන්ගේ වාර්තාව

මූල්‍ය ප්‍රකාශ පිළිබඳව විගණකයින්ගේ වාර්තාව මෙම වාර්තාවේ 17 සහ 21 වැනි පිටුවල සඳහන් කොට ඇත.

**<u>ගිණුම් ප්‍රතිපත්ති සහ පැහැදිලි කිරිම් සටහන්</u>**

සමාලෝචනයට අදාල වර්ෂය තුලදී සමාගම විසින් අනුගමනය කරන ලද ගිණුම් ප්‍රතිපත්ති වල වෙනසක් සිදු වී නැත. මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී භාවිත කරන ලද ගිණුම් ප්‍රතිපත්ති හා පැහැදිලි කිරීම් සටහන් පිටු අංක 36 සිට 72 දක්වා සඳහන් කොට ඇත.

**<u>මූල්‍ය ප්‍රතිඵල / ලාභ සහ විසර්ජන</u>**

විස්තීරණ ආදායම් ප්‍රකාශය 30 පිටුවේ දැක්වේ.

**<u>දේපල, පිරියත හා උපකරණ</u>**

සමාලෝචනයට අදාල වර්ෂය තුළදී සමාගම රු.මිලියන 3.97 ක්, දේපල, පිරියත හා උපකරණ යන විෂයන්හි ආයෝජනය කොට ඇත. මූල්‍ය ප්‍රකාශ සඳහා වූ අංක 10 දරණ සටහන මගින් වර්ෂය තුළදී දේපල, පිරියත හා උපකරණ සංසරණය පිළිබඳ විස්තර දැක්වේ.

**<u>ආයෝජන</u>**

2018 මාර්තු 31 දිනට සමාගම විසින් සිදුකරන ලද දිගුකාලීන ආයෝජන පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශ සඳහා වූ අංක 13,14,15 සහ 16 සටහන් වල 55 සිට 59 දක්වා පිටුවල සඳහන් කොට ඇත.

**<u>ලාභාංශ</u>**

2018 මාර්තු 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා ලාභාංශ ගෙවීම අධ්‍යක්ෂ මණ්ඩලය නිර්දේශ නොකරයි.

**<u>ප්‍රකාශිත ප්‍රාග්ධනය</u>**

2007 අංක 07 දරන සමාගම පනතේ නියමයන් ප්‍රකාරව 2018 මාර්තු 31 දිනට ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.50,000,000.00 ක් වේ. 48 පිටුවේ ඇති මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විස්තර අංක 23 හි දක්වා ඇත.

**<u>ක්‍රියාත්මක සමාගමක් බව</u>**

සමාගමේ ව්‍යාපාරික සැලැස්ම අධ්‍යක්ෂ වරුන් විසින් සමාලෝචනය කරනුලැබ තිබෙන අතර ක්‍රියාත්මක සමාගමක් වශයෙන් ඉදිරියේදී තවදුරටත් පැවතීම සඳහා ප්‍රමාණවත් සම්පත් ඊට ඇති බවට ඔවුන් සෑහීමකට පත්ව සිටිති. එබැවින්, මූල්‍ය ප්‍රකාශ එම පදනම මත පිළියෙල කරන ලදී.

# විගණන කමිටුවේ වාර්තාව

**විගණන කමිටුවේ සංයුතිය**

ලංකා නැව් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන කමිටුව පත්කරනු ලබන අතර එම කමිටුව සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි. සමාලෝචනයට අදාළ මූල්‍ය වර්ෂයතුළ නැව් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් ස්වාධීන, විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂකවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය.

ඒ.කේ.සෙනවිරත්න මහතා - සභාපති (ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ)

ටි.එස්.නානායක්කාර මහතා - සාමාජික (ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ 2017.06.05 දක්වා)

සුරේන් ගුණවර්ධන මහතා - සාමාජික (ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ 2017.07.18 දක්වා)

පූර්ණ පෙරේරා මහතා - සාමාජික (2017.07.18 දින පත්කරන ලදී)

ජානක නන්දකුමාර මහතා - සාමාජික (2017.07.18 දින පත්කරන ලදි)

**විගණන කමිටුවේ කාර්යභාරය**

සමාගමේ මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් සියළු කරුණු විභාග කිරීමේ බලය විගණන කමිටුවට පැවරි ඇති අතර තම රාජකාරි ඉටුකිරීමේදී කාර්යක්ෂමව අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය දේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS/LKAS) ප්‍රකාරව මූල්‍ය වාර්තා පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම හා ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කිරීම් සිදුකර ඇත්දැයි යන්න පමණක් නොව මූල්‍ය වාර්තාකරණය පිළිබඳ නියමතා, 2007 අංක 07 දරන සමාගම් පනත හා සෙසු මූල්‍ය වාර්තාකරණය පිළිබඳ රෙගුලාසිව හා නියමතාවන්ට අනුව සපුරා ඇත්දැයි යන්න විගණන කමිටුව පරීක්ෂා කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට පෙරාතුව විගණන කමිටුව විසින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කොට නිර්දේශ කරන ලදී. සමාගමේ කටයුතුවල තත්ත්වය හා ඊට අදාළ කාලසීමාව තුළ අත්කරගත් ප්‍රතිඵල තුලින් නිවැරදිව පිළිබිඹු වන්නේද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබාගනු පිණිස විගණන කමිටුව විසින් සමාගමේ අභ්‍යන්තර පාලන ක්‍රියාපරිපාටිවල ප්‍රමාණවත් බව හා විධිමත්ව හා අඛණ්ඩව ක්‍රියාත්මක වීම පිළිබඳවද සමාලෝචනය කරන ලදී. අවශ්‍ය විටදී ස්වාධීන අභ්‍යන්තර විගණනද සිදුකරන ලදී. සංස්ථාව තුළ අභ්‍යන්තර පාලන පරිසරය තවදුරටත් ශක්තිමත් කිරීමේ අදහස ඇතිව අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කොට කළමණාකාරිත්වය සමඟ සාකච්ඡා කරනු ලැබේ. තවද විගණන කමිටුව විසින් සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික හා පාලන අවදානම් පිළිබඳවද තක්සේරුවක් කරන ලදී.

**<u>රැස්වීම්</u>**

අදාළ වර්ෂය තුලදී විගණන කමිටු රැස්වීම් 5 ක් පවත්වන ලදී. අධ්‍යක්ෂවරුන්/ සාමාජිකයින් විගණන කමිටුවලට පැමිණීම පහත දක්වා ඇත.

| | | |
|---|---|---|
| ඒ.කේ.සෙනෙවිරත්න මහතා | | 5/5 |
| ටී.එස්.නානායක්කාර මහතා | (5/6/2017 දක්වා) | නොපැමිණි |
| සුරේන් ගුණවර්ධන මහතා | (18.07.2017 දක්වා) | ½ |
| පූර්ණ පෙරේරා මහතා | (05.06.2017 දින පත් කරන ලදී) | 2/3 |
| ජානක නන්දකුමාර මහතා | (18.07.2017 දින පත්කරන ලදී) | නොපැමිණි |
| එම්.ඩී.පී. තිලකසිරි මහතා | | 5/5 |

රැස්වීමකට පැමිණීමට අපහසු නම් ඊට අවසරයක් ඉල්ලීමකට හා න්‍යාය පත්‍රයේ අඩංගු කරුණු පිළිබඳව පූර්වගාමීව කමිටුවේ සභාපති සමඟ සාකච්ඡා කිරීමේ අවස්ථාවක් අධ්‍යක්ෂවරුන්ට ඇත. නොපැමිණි සියළු සාමාජිකයින්, රැස්වීමේ දිනට කලින් ඊට අවසර ඉල්ලා ඇත.

ජාතික විගණන කාර්යාලයේ නියෝජිතයෙකු, රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරි, සාමාන්‍යාධිකාරි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, සහකාර සාමාන්‍යාධිකාරි හා අංශ ප්‍රධානින්ද විගණන කමිටුවේ ආරාධනය පරිදි රැස්වීම්වලට සහභාගි වූහ. අභ්‍යන්තර විගණක, කමිටුවේ කැඳවුම්කරු වශයෙන් කටයුතු කරයි.

**<u>සමාලෝචනය</u>**

2017/2018 වර්ෂය සඳහා පහත දැක්වෙන කරුණු විගණන කමිටුව විසින් සමාලෝචනය කරන ලදී.

1. **ලංකා නැව් සංස්ථාවේ නාවික යාත්‍රා හානිකරණ වීම**
   මෙ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ලිපිලේඛන, කමිටුව විසින් අන්වේෂණය කරන ලදී.
   ***තීරණය :-***
   හානිකරණ ක්‍රියාවලිය සඳහා රජයේ තක්සේරුකරුට නිලවශයෙන් ඉල්ලීමක් ඉදිරිපත් කොට තක්සේරු වාර්තාවක් ලබාගන්නා ලෙස දන්වන ලදී.

2. **වාර්ෂික වාර්තාව 2014/2015**
   2014/2015 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාවේ ප්‍රගතිය කමිටුවට දන්වන ලදී.
   ***තීරණය:-***
   චක්‍රලේඛයේ සඳහන් කරනු ලැබ ඇති කාලසීමාව තුළ යථෝක්ත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලෙස විගණන කමිටුව උපදෙස් දුනි.

3. **විගණන මතය 2015/2016**

සීලොන් බ්‍රීස් නෞකාවේ හානිකරණ තක්සේරුව සඳහා ප්‍රමාණවත් හා යෝග්‍යාකාරයේ විගණන සාක්ෂි නොමැතිවීම සම්බන්ධයෙන් තම විගණන මතය ඉදිරිපත් කර ඇති බව M/S Gajma & Co ආයතනයේ නියෝජිතයින් විසින් දැනුම් දෙන ලදී.

***තීරණය:-***

මීට සුදුසු විසඳුමක් ලෙස මේ පිළිබඳව ශ්‍රී ලංකා වරලත් ගණධිකරණ (CA Sri Lanka) නිලධාරීන් හමුවී එම ආයතනයේ තාක්ෂණික මතය, ලබා ගන්නා ලෙස කමිටු සාමාජිකයින් විසින් උපදෙස් දෙන ලදී.

4. **විගණන කමිටු පත්‍රිකා**

***තීරණය:-***

හඳුන්වාදී ඇති ආකෘති පත්‍රය අනුව විගණන කමිටු පත්‍රිකා පිළියෙල කිරීමටත්, විගණන කමිටු නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගැනීමටත් කමිටුව තීරණය කරන ලදී.

5. **ක්‍රියාකාරි සැලැස්ම**

***තීරණය:-***

තථ්‍ය දත්තවලින් සමන්විත ව්‍යාපාරික සැලැස්මක් පිළිබඳ වාර්තාවක් පිළියෙල කරන ලෙස කමිටුව විසින් උපදෙස් දෙන ලදී.

6. **අතිකාල දීමනා ගෙවීම්**

***තීරණය:-***

අතිකාල දීමනා ගෙවීමේ ක්‍රියාපරිපාටිය යෝජිත ක්‍රියාපරිපාටියට ඇතුළත් කිරිමට කමිටුව තීරණය කළේය.

7. **අභ්‍යන්තර විගණන සැලැස්ම 2017/2018**

විගණන සැලැස්ම කමිටුව විසින් සමාලෝචනය කොට නිර්දේශ කරන ලදි.

***තීරණය:-***

වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම, අනුමැතිය පිණිස අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලෙස විගණන කමිටුව විසින් උපදෙස් දෙන ලදී.

8. **අභ්‍යන්තර පාලන පද්ධතිය**

***තීරණය:-***

කමිටුව අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කළ අතර එය අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලෙස නිර්දේශ කළේය.

9. **විගණන කමිටු ප්‍රඥප්තිය**

***තීරණය:-***

විගණන කමිටු ප්‍රඥප්තිය, අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට කමිටුව තීරණය කළේය.

10. වාර්ෂික වාර්තාව 2015/2016

*තීරණය:-*

දෙන ලද කාලසීමාව ඇතුලත වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කමිටුව තීරණය කරන ලදී.

11. නැව් කුලී කමිටුව

*තීරණය:-*

නැව් කුලී කමිටුවේ ක්‍රියාකාරි සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබේ.

12. වාර්ෂික අයවැය 2017

කමිටුව විසින් 2017 අයවැය විස්තීරණව සමාලෝචනය කරන ලදී.

*තීරණය:-*

වැඩියෙන් සඳහන් කළ/ අඩුවෙන් සඳහන් කල වියදම් සංශෝධනය කොට අධ්‍යක්ෂ මණ්ඩලයට නැවත ඉදිරිපත් කරන ලෙස කමිටුව විසින් උපදෙස් දෙන ලදී.

13. විගණන කමිටු රැස්වීම්

*තීරණය:-*

සෑම මාස දෙකකට වරක් කමිටු රැස්වීමක් සංවිධානය කරන ලෙසට කමිටුව නිර්දේශ කරන ලදී.

14. අලෙවි අංශයට වාහන වෙන්කිරීම

*තීරණය:-*

ප්‍රගමන දැන්වීමක් මත වාහනයක් නිදහස් කරන ලෙස කමිටුව විසින් උපදෙස් දෙන ලද අතර තොරතුරු වාර්තාවක් ඉදිරිපත්කරන ලෙස අලෙවි නිලධාරීන්ට උපදෙස් දෙන ලදී.

15. තාක්ෂණික අගැයීම් කමිටු සාමාජිකයින් පත්කිරීම

**තීරණය.:-**

තාක්ෂණික කෂේත්‍රය සම්බන්ධයෙන් හොඳ දැනීමක් ඇති තාක්ෂණික අගැයිම් කමිටු සාමාජිකයෙකු ඇතුලත් කිරීමට කමිටුව විසින් තීරණය කරන ලදී. කමිටුව පැවසූ පරිදි එකී සාමාජික නැව් අමතර කොටස් ප්‍රසම්පාදන විෂය සම්බන්ධයෙන් විශේෂඥ දැනුම ඇති තාක්ෂණික ඇගයිම් කමිටු සාමාජිකයෙකු වනු ඇත.

16. කළමණාකරණ ලිපිය

කමිටුව විසින් කළමණාකරණ ලිපිය පිළිබඳව සාකච්ඡා කරන ලද අතර තීරණ පහත පරිදි වේ.

(අ) දිගුකාලීන හිඟහිටි ශේෂ (තැන්පතු හා අත්තිකාරම්)

*තීරණය:-*

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව, එ්වා පොත්වලින් කපාහරින ලෙසට කමිටුව විසින් උපදෙස් දෙන ලදී.

(ආ) **ඉන්ධන සීමා**

***තීරණය:-***

ලබාගත් ඉහල මට්ටමේ අනුමැතිය ඉදිරිපත් කිරීමට විගණන කමිටුව විසින් තීරණය කරන ලදී.

***(ඇ) සන්නිවේදන වියදම්***

***තීරණය:-***

අදාළ චක්‍රලේඛ අනුව කටයුතු කිරීමට විගණන කමිටුව විසින් තීරණය කරන ලදී.

***(ඇ) ප්‍රසාද දීමනා ගෙවීම***

***තීරණය:-***

මෙම ක්‍රියාව කරගෙන එනු ලබන්නේ කුමන වර්ෂයේ සිටද යන වග විගණන කමිටුව මූල්‍ය කළමණාකරුගෙන් විමසන ලද අතර ඒ සඳහා අනුමැතීන් ලබාගෙන ඇත්නම් කමිටුවට වාර්තා කරන ලෙස විගණන කමිටුව විසින් මූල්‍ය කළමණාකරුට උපදෙස් දෙන ලදී.

(ඉ) **සභාපතිට හා විධායක අධ්‍යක්ෂකට (ED) ණයපත් දීමනා**

වත්මන් ගෙවීම් බලාත්මක් වන වර්ෂය/ දිනය සඳහන් වන විස්තීරණ වාර්තාවක් පිළියෙල කරන ලෙස කමිටුව විසින් උපදෙස් දෙන ලදී.

(ඊ) **සභාපතිට හා විධායක අධ්‍යක්ෂකට දීමනා ණයපත් දීමනා**

***තීරණය:-***

ඉහල මට්ටමෙන් මේ සඳහා ලබාගත් අනුමැතීන් පිළිබඳ විස්තර වාර්තා කරන ලෙස සහකාර සාමාන්‍යාධිකාරී ට (මූල්‍ය) උපදෙස් දෙන ලදී.

17. **නිවාස ණය පොලිය ප්‍රතිපූර්ණය කිරීම**

***තීරණය:-***

දේපල ණය සම්බන්ධයෙන් අංක 15/2007 iii දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ පදනම අනුගමනය කරන ලෙසත් එය යෝග්‍යකාරයෙන් ලංකා නැව් සංස්ථාවේ සේවා නියුක්තිකයන් සම්බන්ධයෙන් අදාළ කරගන්නා ලෙසත් කමිටුව විසින් උපදෙස් දෙන ලදී. නිවාස ණය වාරිකය හැරුණු කොට මුළු වැටුපෙන් 60% ගණනය කිරිමේදී වැටුපේ වෙනත් අඩුකිරීම් සියල්ල සැලකිල්ලට ගන්නා ලෙස කමිටුව විසින් තවදුරටත් උපදෙස් දෙන ලදී.

<u>නිගමනය</u>

විගණන කමිටුවේ සටහන් හා අනෙකුත් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය හා සුදුසු කටයුතු සඳහා ඉදිරිපත් කරනු ලැබේ. රැස්වීම් වාර්තාවල පිටපත් අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කරනු ලැබේ.

කමිටුව වෙනුවෙන්

ඒ.කේ.සෙනෙවිරත්න

විගණන කමිටුවේ සභාපත

**සී./ස. ලංකා නැව් සංස්ථාව**
**වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය**
2017 / 2018

*<u>තුති ප්‍රණාමය</u>*

*ගරු වරාය, නාවික හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා විසින් ලංකා නැව් සංස්ථාවට නොකඩවා පළකරන ලද උපරිම සහයෝගය සහ උපදෙස් වෙනුවෙන් අපගේ ප්‍රණාමය හිමි වේ.*

*සංස්ථාවේ අභිමතාර්ථයන් මුදුන්පත් කරගැනීමෙහිලා වරාය, නාවික සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ නිලධාරී මහත්ම මහත්මීන් විසින් දෙන ලද සහයෝගය වෙනුවෙන් නැව් සංස්ථාව ස්වකීය ස්තූතිය පළ කරයි. එමෙන්ම ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා රේගුව සහ විදේශ නියෝජිතයන් විසින් සංස්ථාව වෙත සැමවිට පළ කරන ලද සහයෝගය සහ සුහදශීලී බව වෙනුවෙන්ද සංස්ථාව තම කෘතවේදීතාව පළ කරයි.*

*සංස්ථාවේ සේවා ගණුදෙනුකරුවන් හා ඔවුන්ගෙන් ලද සහයෝගය වෙනුවෙන් සංස්ථාව ස්තුති පූර්වක ප්‍රණාමය පළකරමි.*

*කාර්ය මණ්ඩලයට ස්තුතිය*

*සුහදශීලී සහ සහයෝගශීලී භාවයෙන් යුතුව, සමාලෝචිත වර්ෂය තුළ දී කළමනාකාරීත්වය/ සේවක මහත්ම මහත්මීන් අතර නිරන්තර සම්බන්ධතාවක් පැවතුණි.*
*කළමනාකාරීත්වය සමඟ කටයුතු කිරීමේදී වෘත්තිය සංගම් ඉතා වගකීමෙන් හා ප්‍රතිචාරාත්මකව කටයුතු කළ බව කිවමනාය.*
*අවසාන වශයෙන් එතෙර මෙතෙර සියලු සේවක මහත්ම මහත්මීන් විසින් විශේෂයෙන්ම නාවික ක්ෂේත්‍රය මුහුණ දෙමින් සිටින දුෂ්කරතා අභියස ආයතනය වෙනුවෙන් සේවය ඉටු කිරීමේදී හෘදයංගමව දක්වන ලද පක්ෂපාතී බව හා කැපවීම අගය කළ යුතුය.*

මගේ අංකය
எனது இல.
My No. } POS/B/CSCL/1/18/59

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 24 January 2020

To the shareholders of the
Ceylon Shipping Corporation Limited.

**Report of the Auditor General on the Financial Statements of the Ceylon Shipping Corporation Limited for the year ended 31 March 2018.**

---

The audit of financial statements of the Ceylon Shipping Corporation Limited ("the Company") for the year ended 31 March 2018 comprising the statement of financial position as at 31 March 2018 and the statement of comprehensive income, statement of changes in equity and statement of cash flows for the year then ended and a summary of significant accounting policies and other explanatory information, was carried out under my direction in pursuance of provisions in Article 154(1) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka.

**Board's Responsibility for the Financial Statements**

---

The Board of Directors ("Board") is responsible for the preparation and fair presentation of these financial statements in accordance with Sri Lanka Accounting Standards and for such internal control as the Board determines is necessary to enable the preparation of financial statements that are free from material misstatements, whether due to fraud or error.

**Auditor's Responsibility**

---

My responsibility is to express an opinion on these financial statements based on my audit. I conducted my audit in accordance with Sri Lanka Auditing Standards. Those Standards require that I comply with ethical requirements and plan and perform the audit to obtain reasonable assurance about whether the financial statements are free from material misstatements.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

An audit involves performing procedures to obtain audit evidence about the amounts and disclosures in the financial statements. The procedures selected depend on the auditor's judgment, including the assessment of the risks of material misstatement of the financial statements, whether due to fraud or error. In making those risk assessments, the auditor considers internal control relevant to the Company's preparation and fair presentation of the financial statements in order to design audit procedures that are appropriate in the circumstances, but not for the purpose of expressing an opinion on the effectiveness of the Company's internal control. An audit also includes evaluating the appropriateness of accounting policies used and the reasonableness of accounting estimates made by Board, as well as evaluating the overall presentation of the financial statements.

I believe that the audit evidence I have obtained is sufficient and appropriate to provide a basis for my qualified audit opinion.

**Basis for the Opinion**

---------------------------

(a) As per the paragraph 32 of the Sri Lanka Accounting Standards on Presentation of Financial Statements (LKAs 01), offsetting of assets and liabilities or income and expenses is not permitted unless required by other SLFRS, however contrary to that the Company had set off credit balances against the debit balances of trade and other receivables. As a result, total trade and other receivable and trade and other payables had been understated by Rs.41,202,849 as at the end of the year under review.

Further, ten (10) expense accounts and two (02) control accounts which were represented credit balances aggregating to Rs.20,057,734, had set off against the direct expenses. As a result, direct expenses had understated by similar amount.

(b) The Company had decided to recognized the un identified deposit credited to bank account in year 2009 amounting to Rs.519,517 as other income. However, it had been erroneously credited to the cash book and debited to the income account of the year under review. As a result, the cash at the bank and other income as at 31 March 2018 had been understated by Rs.1,039,034.

(c) Office rental expense amounting to Rs.1,521,240 which relevant to the year 2018/19 had recognized as an expense of the year under review. As a result, the office rent expense and the loss for the year ended had been overstated by similar amount.

(d) The Company had calculated deferred tax asset without considering the correct current and previous years' tax losses and capital allowances on the assets purchased in previous year. As a result, the deferred tax assets as at 31 March 2018 and the provision for the year under review had been understated by Rs.2,299,463.

## Qualified Opinion

In my opinion, except for the effects of the matters describe in Basis for Qualified Opinion paragraph, the financial statements give a true and fair view of the financial position of the Company as at 31 March 2018, and its financial performance and its cash flows for the year then ended in accordance with Sri Lanka Accounting Standards.

## Report on Other Legal and Regulatory Requirements

As required by Section 163 (2) of the Companies Act, No.07 of 2007, I state the followings:

(a) The basis of qualified opinion and scope and limitations of the audit are as stated above.

(b) In my opinion:

- Except for the effect of the matters described in basis for qualified opinion paragraph, I have obtained all the information and explanations that were required for the audit and as far as appears from my examination, proper accounting records have been kept by the Company.

- The financial statements of the Company comply with the requirements of Section 151 of the Companies Act, No. 07 of 2007.

**Report to Parliament**

----------------------------

My report to Parliament in pursuance of provisions in Article 154 (6) of the Constitution will be tabled in due course.

W.P.C. Wickramarathne
Auditor General

**ජාතික විගණන කාර්යාලය**

මගේ අංකය : POS/B/CSCL/1/18/59 දිනය : 2020 ජනවාරි 24

**සී/ස ලංකා නැව් සංස්ථාවේ කොටස්ධාරීන් වෙත,**

**2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සී/ස ලංකා නැව් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳව විගණකාධිපතිගේ වාර්තාව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තිය ප්‍රකාරව මාගේ උපදෙස් අනුව 2018 මාර්තු 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීරණ ආදායම් පිළිබඳ ප්‍රකාශය, කොටස් ස්කන්ධ වෙනස්වීමේ පිළිබඳ ප්‍රකාශය මුදල් ප්‍රවාහ ප්‍රකාශය, කැපී පෙනෙන ගිණුම් ප්‍රතිපත්ති සහ සෙසු පැහැදිලි කිරීම් සටහන් සාරාංශයක්ද ඇතුළත්, සී/ස ලංකා නැව් සංස්ථාවේ ("සමාගමේ") මූල්‍ය ප්‍රකාශ මා විසින් විගණනය කරන ලදී.

**මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය (" මණ්ඩලය") සතු වන අතර වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ වලින් තොරව එවැනි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

**විගණකගේ වගකීම**

මාගේ වගකීම වන්නේ විගණනය පදනම් කරගෙන මෙම මූල්‍ය ප්‍රකාශ පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ප්‍රකාරව මෙම විගණනය මවිසින් පවත්වන ලදී. එකී ප්‍රමිතීන් හා නියමතාවන්ට අනුව, මා විසින් මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක හා සාවද්‍ය වලින් තොරදැයි යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබාගනු පිණිස විගණනය සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම හා ගිණුම්කරණය පිළිබඳ ආචාර ධර්මවල නියමතාවන් අනුව විධිමත්ව කටයුතු කිරීම අපේක්ෂා කෙරේ.

මූල්‍ය ප්‍රකාශයන්හි ගණන් හිලව් හා හෙළදරව් කිරීම් පිළිබඳව විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා විගණනයකදී අනුගමනය කළයුතු ක්‍රියාවලිය විගණනයක අඩංගු වේ. වංචනික හෝ වැරදීමකින් මූල්‍ය ප්‍රකාශයන්හි අඩංගු වන බරපතල අවප්‍රකාශ සම්බන්ධයෙන් උද්ගත වන අවදානම් පිළිබඳ තක්සේරුව ඇතුළුව විගණකවරයාගේ නිගමනය මත තෝරා ගන්නා වූ ක්‍රියාපටිපාටිය රඳා පවතිනු ඇත.

එකී අවදානම් තක්සේරු කිරීමෙදී, පවත්නා තත්ත්වයන්ට යෝග්‍ය වන පරිදි විගණන ක්‍රියාපටිපාටිය සැලසුම් කිරීමේදී (එහෙත් සමාගමේ අභ්‍යන්තර පාලනයෙහි සඵලතාව පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට නොව) සමාගමේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණව ඉදිරිපත් කිරීම පිළිබඳව සැලකිල්ලට ගනු ලබයි. භාවිතා කළ ගිණුම් ප්‍රතිපත්තිවල යෝග්‍යතාව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කරන ලද සමස්ත ගිණුම් ප්‍රකාශ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මා විසින් ලබා ගන්නා ලද විගණන සාක්ෂි, මාගේ විගණන මතය ප්රකාශ කිරීම සඳහා ප්‍රමාණවත් හා යෝග්‍ය බව මාගේ මාගේ විශ්වාසයයි.

<u>මතය සඳහා වූ පදනම</u>

(අ) මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම පිළිබඳව (LKAs 01) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්හි 32 ඡේදය අනුව වත්කම් සහ වගකීම් හෝ ආදායම් හා වියදම් හිලව් කිරීමට ( අනෙකුත් ශ්‍රී ලංකා මුදල් රෙගුලාසිවලින් නියම කොට ඇත්තේ නම් මිස) අවසර නොලැබේ. කෙසේ නමුත් ඉන් බැහැර වී ක්‍රියාකරමින් සමාගම විසින් වෙළඳ හා අනෙකුත් ලැබීම් නියමිතවල හර ශේෂයන් අනුව ණය ශේෂයන් හිලව් කොට ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මුළු වෙළඳාම හා අනෙකුත් ලැබීම් නියමිත සහ වෙළඳ හා අනෙකුත් ගෙවීම් නියමිත සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.41,202,849 ක් අඩුවෙන් සඳහන් කොට තිබුණි.

තවද, රු.20,057,734 ක වටිනාකමක් නියෝජනය වූ වියදම් ගිණුම් 10 ක් හා පාලන ගිණුම් 02 ක් ඍජු වියදම්වලට හිලව් කර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඍජු වියදම් වශයෙන් ඊට සමාන මුදලක් අඩුවෙන් සඳහන් කොට තිබුණි.

(ආ) වෙනත් ආදායම් යටතේ රු.519,517.00 ක වටිනාකමකින් යුත් හඳුනා නොගත් තැන්පතු 2009 වර්ෂයේදී බැංකු ගිණුමට බැර කිරීමට සමාගම විසින් තීරණය කර තිබුණි. කෙසේ නමුත් එය වැරදි ලෙස මුදල් පොතට බැරකොට සමාලෝචිත අදාළ වර්ෂයේ ආදායම් ගිණුමට හරකොට තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2018 මාර්තු වන විට බැංකුවේ පැවති මුදල හා අනෙකුත් ආදායම් රු.1,039,034 ක් අඩුවෙන් සඳහන්කොට තිබුණි.

(ඇ) 2018/19 වර්ෂයට අදාළ - කාර්යාල කුලී වෙනුවෙන් වූ රු.1,521,240 ක වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස හඳුනාගෙන තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් කාර්යාල කුලී වියදම් හා ගතවූ වර්ෂය සඳහා පාඩුව ඊට සමාන මුදලකින් වැඩියෙන් සඳහන් කොට තිබුණි.

(ඈ) වත්මන් වර්ෂයේ හා ඉහත වර්ෂයේ බදුපාඩු පසුගිය වර්ෂයේ මිලදිගත් වත්කම් මතවූ ප්‍රාග්ධන දීමනා සැලකිල්ලට නොගනිමින් සමාගම විසින් විලම්භිත බදු වත්කම් ගණනය කොට තිබුණි.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2018 මාර්තු 31 දින වනවිට විලම්භිත බදු වත්කම් හා සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන රු.2,299,463 ක් අඩුවෙන් සඳහන් කොට තිබුණි.

**මතය**

"මතය සඳහා වූ පදනම" ඡේදයෙහි පැහැදිලි කරන ලද කරුණු වලින් ඇතිවන බලපෑම හැරුණුකොට මෙහිවූ මූල්‍ය ප්‍රකාශයන් තුලින් 2018 මාර්තු 31 දිනට සී/ස ලංකා නැව් සංස්ථාවේ මූල්‍ය කාර්ය සාධනය සහ මූල්‍ය ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස පිළිබිඹු කරන බව මාගේ මතයයි.

**වෙනත් නෛතික හා පාලනාත්මක නියමතා පිළිබඳ වාර්තාව**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ නියමතාවන්ට අනුව පහත දෑ වාර්තා කරමි.

(අ). මතයේ පදනම, විගණනයේ විෂය පථය හා සීමාකාරකයන් ඉහත දැක්වෙන පරිදි වේ.

(ආ). මාගේ මතයට අනුව :

"මතය සඳහා පදනම" ඡේදයෙහි පැහැදිලි කරන ලද කරුණුවලින් ඇතිවන බලපෑම හැරුණු කොට විගණනය පිණිස අවශ්‍ය වූ තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර මාගේ විමර්ශනයට අනුව පෙනීයන පරිදි සමාගම විසින් ගිණුම් පිළිබඳව විධිමත් ලෙස වාර්තා පවත්වාගෙන ඇති බව පෙනේ.

2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියට සමාගමේ මූල්‍ය ප්‍රකාශ අනුකූල වේ.

**පාර්ලිමේන්තුවට වාර්තා කිරීම**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වැනි වගන්තියට අනුව යථා කාලයේදී මාගේ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අත්සන් කලේ,
ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

සී/ස ලංකා නැව් සංස්ථාව

මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය

| | සටහන | 2018 | 2017 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **ආදායම** | 4 | 2,499,470,005 | 2,541,008,930 |
| සෘජු මෙහෙයුම් වියදම | | (1,665,635,224) | (1,600,439,754) |
| **දළ ලාභය** | | **833,834,781** | **940,569,176** |
| වෙනත් ආදායම් | 5 | 256,707,888 | 182,979,559 |
| පරිපාලන වියදම් | | (219,929,477) | (209,857,125) |
| **වත්කම් හානිකරණ වීමට පෙර මෙහෙයුම්වලින් ලාභ** | | 870,613,191 | 913,691,609 |
| වත්කම් හානිකරණ වීම | | (59,383,630) | (42,265,427) |
| **මෙහෙයුම්වලින් ලාභය** | 6 | 811,229,561 | 871,426,182 |
| මූල්‍ය වියදම් | 7 | (1,061,395,928) | (1,153,851,255) |
| ආශ්‍රිත සමාගම්වල (ශුද්ධ බදු සහිත) ලාභයේ කොටස | 14.2 | 17,111,132 | 12,506,937 |
| **බද්දට පෙර (ලාභය/පාඩුව)** | | **(233,055,234)** | **(269,918,135)** |
| ආදායම් බදු ආදායම්/ (වියදම්) | 8 | (12,214,634) | (7,281,062) |
| **වර්ෂය සඳහා ලාභය/ (පාඩුව) ආ.බද්දෙන් පසුව** | | **(245,269,868)** | **(277,199,197)** |
| වර්ෂය සඳහා විලම්භිත බදු ගැලපුම්කිරීම් | | **69,713,367** | **40,188,545** |
| **ආදායම් බද්දෙන් පසුව හා විලම්භිත බදු ගැලපුම් පසුව වර්ෂය සඳහා ලාභය (පාඩුව)** | | **(175,556,501)** | **(237,010,652)** |
| **කොටසක් සඳහා මූලික හා තනුක ඉපැයීම්** | 9 | **(49)** | **(55)** |
| වර්ෂය සඳහා ලාභය | | (175,556,501) | (237,010,652) |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | | |
| විකිණීම සඳහා වූ මූල්‍ය වත්කම්වල සාධාරණ අගය | 16.1 | 2,122,703 | (3,482,187) |
| ජීවගණක උපකල්පන වෙනස්කම්වලින් ඇති වූ පාඩු | 29.1 | (633,608) | (12,507,919) |
| ආශ්‍රිත සමාගම්වල අනෙකුත් විස්තීරණ ආදායමේ කොටස (බදු සහිත) | 14.2 | 5,784,547 | 4,083,099 |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | | **(168,282,859)** | **(248,917,659)** |

පිටු අංක 36 සිට 72 දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම කොටසක් නියෝජනය කරයි.

**සී/ස ලංකා නැව් සංස්ථාව**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**
**මාර්තු 31 වැනි දිනට**

| වත්කම් | සටහන් | 2018 | 2017 |
|---|---|---|---|
| | | රු. | රු. |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපල, පිරියත හා උපකරණ | 10 | 10,467,909,940 | 10,881,232,887 |
| කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්ය (යාත්‍රා) | 11 | - | - |
| අස්පෘශ්‍ය වත්කම් | 12 | - | - |
| පාලිත සමාගම්වල ආයෝජන | 13 | - | - |
| ආශ්‍රිත සමාගම්වල ආයෝජන | 14 | 305,496,989 | 282,954,432 |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම් | 16 | 21,219,044 | 19,096,341 |
| විලම්භිත බදු වත්කම් | 17 | 125,300,596 | 4,522,073 |
| ජංගම නොවන මුළු වත්කම් | | 10,919,926,569 | 11,187,805,733 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | | 197,380,995 | 185,156,665 |
| වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත | 18 | 1,519,834,219 | 1,118,606,987 |
| ව්‍යවස්ථාපිත ලැබීම් | 19 | 27,638,001 | 25,158,392 |
| කල්පිරීම් ආයෝජන | 20 | 420,327,291 | 689,224,659 |
| කෙටිකාලීන ආයෝජන | 21 | 295,430,308 | 274,558,561 |
| මුදල් හා මුදල් සාමන්‍යයන් | 22 | 411,380,464 | 149,226,908 |
| මුළු ජංගම වත්කම් | | 2,871,991,277 | 2,441,932,172 |
| **මුළු වත්කම්** | | 13,791,917,848 | 13,629,737,905 |
| **කොටස් ස්කන්ධ හා බැරකම්** | | | |
| **කොටස් ස්කන්ධ** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 23 | 50,000,000 | 50,000,000 |
| කොටස් ප්‍රාග්ධනය සඳහා දායකත්වය | 24 | 543,939,497 | 543,939,497 |
| **ප්‍රාග්ධන සංචිත** | 25 | 767,029,766 | 767,029,766 |
| ප්‍රත්‍යාගණන සංචිත | 26 | 3,065,444 | 3,065,444 |
| විකිණීම සඳහා තිබෙන මූල්‍ය වත්කම් සංචිතය | | 15,738,852 | 13,616,149 |
| රඳවාගත් ඉපැයීම් | | (350,742,997) | (233,099,911) |
| **මුළු කොටස් ස්කන්ධ** | | 1,029,030,561 | 1,144,550,944 |

| | සටහන් | 2018 | 2017 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **ජංගම නොවන බැරකම්** | | | |
| දිගුකාලීන ණය ගැනුම් | 28 | 10,002,263,026 | 9,774,878,448 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදියාවන් - පාරිතෝෂික | 29 | 36,773,560 | 39,552,097 |
| විලම්භිත බදු බැඳියාවන් | 17 | - | - |
| මුළු ජංගම නොවන බැරකම් | | 10,039,036,586 | 9,814,430,545 |
| **ජංගම බැරකම්** | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවීම් නියමිත | 30 | 1,307,570,920 | 1,030,696,520 |
| කෙටිකාලීන ණයට ගැනුම් | 31 | 1,322,916,000 | 1,569,882,000.00 |
| ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත | 32 | 85,856,628 | 63,497,528 |
| උපචිත වියදම් | 33 | 7,507,154 | 6,680,368 |
| මුළු ජංගම බැරකම් | | 2,723,850,702 | 2,670,756,416 |
| **මුළු ස්කන්ධ හා බැරකම්** | | 13,791,917,848 | 13,629,737,905 |

පිටු පස අංක 36 සිට 72 දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම කොටසක් නියෝජනය කරයි. 2007 අංක 07 දරන සමාගම් පනතේ නියමතාවන් අනුව මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරන ලදී.

සහකාර සාමාන්‍යාධිකාරි (මූල්‍ය)

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය දරයි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් තබන ලදී.

අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ

## සී/ස. ලංකා නැව් සංස්ථාව

# 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කොටස් ආයෝජන වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | කොටස් ප්‍රාග්ධනය සඳහා දායකත්වය | ප්‍රාග්ධන සංචිතය | ප්‍රත්‍යාගණන සංචිතය | විකිණීමට ඇති මූල්‍ය වත්කම් සංචිතය | රඳවාගත් ඉපැයීම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 2016 අප්‍රේල් 01 දිනට ශේෂය | 50,000,000 | 543,939,497 | 767,029,766 | 3,065,444 | 17,098,336 | 12,335,561.00 | 1,393,468,604 |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | - | | (237,010,652.00) | (237,010,652) |
| අනෙකුත් විස්තීරණ ආදායම් | - | - | - | - | (3,482,187) | (8,424,820.00) | (11,907,007) |
| 2017 මාර්තු 31 දිනට ශේෂය | 50,000,000 | 543,939,497 | 767,029,766 | 3,065,444 | 13,616,149 | (233,099,911.00) | 1,144,550,945 |
| අවුරුද්ද සඳහා පාඩුව | - | - | - | - | | 52,762,469.90 | 52,762,470 |
| IFRS සඳහා ක්ෂයවීම් ගැලපුම් | - | - | - | - | | (175,556,501.16) | (175,556,501) |
| අනෙකුත් විස්තීරණ ආදායම් | - | - | - | - | 2,122,703 | 5,150,945.60 | 7,273,649 |
| 2018 මාර්තු 31 දිනට ශේෂය | 50,000,000 | 543,939,497 | 767,029,766 | 3,065,444 | 15,738,852 | (350,742,996.66) | 1,029,030,561 |

පිටු අංක 36 සිට 72 දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යාම කොටසක් නියෝජනය කරයි.

## සී/ස. ලංකා නැව් සංස්ථාව
## මාර්තු 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන | 2018 | 2017 |
|---|---|---|---|
| **මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහ** | | | |
| බද්දට පෙර ලාභය/ පාඩුව | | (233,055,234) | (269,918,135) |
| ගැලපුම් | | | |
| ක්ෂයවීම් | | 417,268,522 | 363,576,622 |
| ස්ථාවර වත්කම් බැහැර කිරිමේදී ලාභය/ පාඩුව | | (54,755) | (19,740,653) |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 5,004,531 | 4,397,543 |
| ලාභාංශය ආදායම | | (52,636) | (46,191) |
| ආශ්‍රිත සමාගම්වල ලාභයේ කොටස (බදු සහිත) | | (17,111,132) | (12,506,937) |
| වෙළඳණය ගැතියන් අඩුවීම වෙනුවෙන් ප්‍රතිපාදන | | 59,383,630 | 42,265,427 |
| පොලි ආදායම් | | (73,059,766) | (60,875,650) |
| පොලි වියදම් | | 767,082,249 | 651,923,689 |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | | **925,405,409** | **699,075,715** |
| තොග භාණ්ඩ (වැඩි වීම)/ අඩුවීම | | (12,224,330) | (104,807,750) |
| වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත (අඩුවීම) | | (401,227,232) | (79,224,694) |
| වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිත (අඩුවීම)/ වැඩි වීම | | 276,874,400 | 37,192,880 |
| ව්‍යවස්ථාපිත ලැබීම් නියමිත (අඩුවීම)/ වැඩි වීම | | (2,479,609) | |
| ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත (අඩුවීම)/ වැඩි වීම | | 19,879,491 | 34,730,241 |
| උපචිත වියදම් වැඩිවීම | | 826,786 | (495,467) |
| **මෙහෙයුම්වලින් ලැබූ මුදල්** | | **807,054,915** | **586,470,925** |
| ගෙවූ පාරිතෝෂිත | | (8,416,675) | (4,580,032) |
| ගෙවූ පොලිය | | (767,082,249) | (651,923,689) |
| ගෙවූ බදු | | | (12,098,374) |
| **මෙහෙයුම් කටයුතු වලින් ලැබූ මුළු මුදල් ප්‍රවාහය** | | **31,555,991** | **(82,131,169)** |
| ආයෝජන කටයුතුවලින් මුදල් ප්‍රවාහ | | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | | (3,967,761) | (5,014,947) |
| යාත්‍රා පිරිවැය ගෙවීම් | | - | (2,217,589,483) |
| ස්ථාවර වත්කම් බැහැර කිරිමෙන් ලත් මුදල් | | 55,750 | 19,740,653 |
| කල් පිරිමට ඇති මූල්‍ය වත්කම් වලින් (ආයෝජන වලින්) ලද මුළු මුදල | | 192,439,285 | (538,843,959) |
| කෙටිකාලීන ආයෝජන සමස්තයක් වශයෙන් | | - | (25,431,020) |
| ලැබුණු පොලිය | | 40,872,933 | 52,913,054 |
| ලැබූ ලාභාංශ | | 52,636 | 46,191 |
| **ආයෝජන කටයුතුවල යෙදවූ මුදල** | | **229,452,843** | **(2,714,179,511)** |
| මූල්‍ය කටයුතුවලින් වූ මුදල් ප්‍රවාහය | | | |
| යාත්‍රාණය වලින් ලැබූ මුදල් | | - | 2,558,535,947 |

| | | | |
|---|---|---|---|
| මූල්‍ය කටයුතුවලින් ලැබූ මුළු මුදල | | - | 2,558,535,947 |
| මුදල් හා මුදල්  සාමානායයන් මුළු වැඩිවීම | | 261,008,834 | (237,774,733) |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සාම්‍යයන් | | 150,371,630 | 388,146,363 |
| වසර අගදී මුදල් හා මුදල් සාම්‍යයන් | සටහන 22 | 411,380,464 | 150,371,630 |

පිටු අංක 36 සිට 72 දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම කොටසක් නියෝජනය කරයි.

## සී/ස ලංකා නැව් සංස්ථාව

**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

**2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිලි කිරීමේ සටහන්**

### 1. සාමාන්‍ය තොරතුරු

### 1.1 අස්ථිතිය හා නෛතික ආකෘතිය

ශ්‍රී ලංකාවේ පිහිටියා වූ ද, 1992 වර්ෂයේ දී ස්ථාපනය කරන ලද්දා වූ ද සී/ස ලංකා නැව් සංස්ථාව වූ කලී ලංකා නැව් සංස්ථාවට (CSC) අනුප්‍රාප්තික ආයතනයක් වන අතර මෙය 1971 අංක 11 දරන ලංකා නැව් සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ආයතනයකි. මෙහි ලියාපදිංචි කාර්යාලය සහ ව්‍යාපාරික කටයුතු කිරීමේ ප්‍රධාන ස්ථානය කොළඹ රසීක් ෆරීඩ් මාවතේ, යෝනක ඉස්ලාමීය සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැඟිල්ලේ අංක 27 දරන ස්ථානයේ පිහිටා තිබේ.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

නාවික ගමනාගමනයට අදාල කළමනාකරණය, නැව්වල හිමිකාරිත්වය දැරීම හා යාත්‍රා කුලියට දීම යනාදී සේවාවන් ඉටුකිරීම.

### 1.3 සේවකයින් සංඛ්‍යාව

2018 මාර්තු 31 දිනට මුළු සේවක සංඛ්‍යාව 116 ක් විය. (2017 මාර්තු 31 දිනට 125)

### 1.4 වාර්තා කිරීමේ දිනය

සමාගමේ මූල්‍ය වාර්තාකරණ දිනය මාර්තු 31 දිනෙන් අවසන් වන අතර ආශ්‍රිත සමාගම්වල මූල්‍ය වාර්තාකරණ කාලසීමාව දෙසැම්බර් 31 දිනෙන් අවසන් වේ. සමාගමේ වාර්තාකරණ කාලසීමාවේ අවසන් දිනය හා ආශ්‍රිත සමාගම්වල වාර්තා කිරීමේ අවසන් දිනට කැපීපෙනෙන කිසියම් ගණුදෙනු වේ නම්, සමාගම ඒවා සම්බන්ධයෙන් අවශ්‍ය ගැලපීම් කරයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශ සඳහා අනුමැතිය

මෙම මූල්‍ය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ 2019 ජූනි මස 28 වැනි දින නිකුත් කිරීමට බලය දෙන ලදී.

## 2. පිළියෙල කිරීමේ පදනම

### 2.1 අනුකූලතා ප්‍රකාශය

සමාගමේ විස්තීරණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, කොටස් ස්කන්ධය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සටහන් යනාදිය වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුව හා 2007 අංක 7 දරන සමාගම් පනතේ නියමතාවන්ට අනුව පිළියෙල කරන ලදී.

### 2.2 ගණනය කිරීමේ පදනම

සාධාරණ මිල අනුව ගණනය කරන ලදුව විකිණීමට තිබෙන මූල්‍ය වත්කම් ගණයෙහිලා සැලකෙන ලැයිස්තුගත ආයෝජන හා ඉඩම් ප්‍රත්‍යාගණනය කිරීම හැර සමාගමේ මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය සම්ප්‍රදාය අනුව ගණනය කරන ලදී.

මූල්‍ය ප්‍රකාශවලට බලපෑමක් ඇතිවන උද්ධමනකාරී සාධක වෙනුවෙන් ගැලපුම් නොකෙරිණි.

### 2.3 සංසන්දනාත්මක සංඛ්‍යා

වත්මන් වර්ෂයේ ඉදිරිපත් කිරීම්වලට අනුකූල වන අයුරු අවශ්‍ය තන්හිදී ඉහත වර්ෂයේ සංඛ්‍යා සහ ඡේද නැවත වර්ගීකරණය කරන ලදී.

### 2.4 කාර්යීය හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුලත් භාණ්ඩ විෂයන් මනිනු ලබන්නේ සමාගම ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරය තුළ ව්‍යවහාර වන මුදල් ඒකක භාවිත කිරීමෙනි. ශ්‍රී ලංකා රුපියලේ ආසන්න අගයට වටයනු ලැබේ. සමාගමේ කාර්යීය හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් අනුව ශ්‍රී ලංකා රුපියල්වලින් මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කෙරේ.

### 2.5 ඇස්තමේන්තු හා තීන්දු භාවිත කිරීම

ශ්‍රී ලංකා මූල්‍ය රෙගුලාසි ප්‍රමිති (SLFRS) අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී ගිණුම් ප්‍රතිපත්ති මෙන්ම වත්කම්, වගකීම් ආදායම් හා වියදම් පිළිබඳව වාර්තා වී ඇති ප්‍රමාණයන් කෙරෙහි බලපෑමක් ඇති කෙරෙන අයුරින් කළමනාකාරීත්වය විසින් තීන්දු තීරණ හා උපකල්පනයන් සිදු කිරීම අවශ්‍ය වේ. තථ්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලින් වෙනස් විය හැකි ය.

ඇස්තමේන්තු හා වැදගත් උපකල්පනයන් අඛණ්ඩව සමාලෝචනය කරනු ලැබේ. ගිණුම් ඇස්තමේන්තු සඳහා වන සංශෝධන ඇස්තමේන්තු සංශෝධනය කරනු ලබන හා බලපෑමට යටත්විය හැකි ඉදිරි කාලය තුළ හඳුනාගනු ලැබේ.

### 2.6 වැදගත් අවැදගත් බව හා සමූහනය

සමාන භාණ්ඩ විෂයන්හි එක් එක් ද්‍රව්‍ය පංතිය වෙන වෙනම මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇත. අසමාන ස්වභාවයෙන් යුක්ත භාණ්ඩ විෂයන් හෝ කාර්ය කටයුතු නොවැදගත් වන්නේ නම් වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

## 3. කැපී පෙනෙන ගිණුම් ප්‍රතිපත්ති සම්පිණ්ඩනය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය රෙගුලාසි හා ප්‍රමිතිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ, සමාගම විසින් පිළියෙල කරන ලදී. මෙකී මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී යොදා ගන්නා ලද ප්‍රධාන ගිණුම් ප්‍රතිපත්ති පහත දක්වා ඇත. වෙනත් යම් ආකාරයකින් දක්වා නොමැත්තේ නම් මිස, සියලු වර්ෂයන්හි දී මෙම ප්‍රතිපත්ති අනවරතව යොදා ගන්නා ලදී.

### 3.1 විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු / පරිවර්තන

ගනුදෙනුව සිදුවන දිනයේ දී බලපවත්නා විදේශ විනිමය අනුපාතය අනුව විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීම සිදු කෙරේ. විදේශ විනිමය අනුව වටිනාකම දැක්වෙන මූල්‍ය වත්කම් සහ වගකීම් සම්බන්ධයෙන් ගත්කල මූල්‍ය තත්ත්වය ප්‍රකාශිත දිනයන්හි දී බලපැවැත්වෙන විදේශ විනිමය අනුපාතයට අනුව ශ්‍රී ලංකා රුපියලට පරිවර්තනය කෙරේ. එකී පරිවර්තනයන්හි දී උද්ගත වන වෙනස්කම් ලාභ හෝ අලාභ ගිණුමේ දී හඳුනා ගැනේ. ඓතිහාසික පිරිවැය පදනම යටතේ සඳහන් කරන ලද විශේෂ ව්‍යවහාර මුදල් වටිනාකම අනුව වූ මූල්‍ය නොවන වත්කම් හා වගකීම්වල වටිනාකම ගණුදෙනුව සිදු වූ දිනයේ බලපැවැත් වූ විදේශ විනිමය අනුපාතය අනුව පරිවර්තනය කරන ලදී.

### 3.2 ආදායම් බදු වියදම්

වර්ෂය සඳහා වූ බදු වියදම්වලට ඇතුළත් වන්නේ වත්මන් හා විලම්බිත බදු ය. ලාභය හෝ අලාභය තුළ බද්ද හඳුනා ගැනෙන අතර වෙනත් විස්තීරණ ආදායම් වශයෙන් සෘජුවම හඳුනා ගැනෙන ආදායම් හෝ වියදම් විෂයකට අදාල වන වෙනස්කමක් ඇතුලත් වන්නේ නැත.

#### (අ) ප්‍රවර්තන බදු

ප්‍රවර්තන බදු යනුවෙන් හැඳින්වෙන්නේ වර්ෂය සඳහා ගෙවීමට නියමිත බද්දට යටත් ආදායම වෙනුවෙන් ගෙවීමට අපේක්ෂිත බද්ද යි. වාර්තා කරන දිනයට බලාත්මක වන බදු අනුප්‍රමාණයන් සහ ඉහත වර්ෂය සම්බන්ධයෙන් ගෙවිය යුතු බද්දට වූ වෙනත් ගැලපුම් මේ සඳහා අදාල කරගනු ලැබේ.

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ ඉන් ඉක්බිති සංශෝධන ප්‍රකාරව සමාගමේ බදු බැඳියාව ගණනය කොට තිබේ.

(ආ) <u>විලම්බිත බද්ද</u>

මූල්‍ය ප්‍රකාශයන් තුළ දැක්වෙන වත්කම්වල ඉදිරියට ගෙනයන වටිනාකම හා ඒවාට අනුරූප බදු පදනම්වල (තාවකාලික වෙනස්කම් වශයෙන් හඳුන්වනු ලබන) වෙනස මත විලම්බිත බද්ද හඳුනා ගැනේ. ඉදිරියේ දී බද්දට යටත් ලාභය වැඩිවෙතැයි අපේක්ෂා කරන සියලු තාවකාලික වෙනස්කම් වෙනුවෙන් විලම්බිත බදු බැඳියාවන් හඳුනා ගනු ලැබේ. ඉදිරියේ දී බද්දට යටත් ලාභය අඩුවෙතැයි අපේක්ෂිත සියලු තාවකාලික වෙනස්කම් සහ භාවිතා නොකළ බදු පාඩු හා බදු වාසි වෙනුවෙන් විලම්බිත බදු වත්කම් හඳුනා ගැනේ.

විලම්බිත බද්දේ ඉදිරියට ගෙන යන වටිනාකම එක් එක් වාර්තා කිරීමේ දිනයට සමාලෝචනය කරනු ලබන අතර ඉදිරි බද්දට යටත් ලාභවල ප්‍රවර්තන තක්සේරුව පිළිබිඹු වන සේ ගැලපුම් කරනු ලැබේ. ගැලපුම් කිසිවක් වේ නම් ලාභ හෝ අලාභයන් තුළ ඒවා හඳුනාගනු ලැබේ.

වාර්තා තිරීමේ අවසන් දිනය වන විට බලාත්මක කරුණු ලැබ තිබෙන හෝ සැලකිය යුතු තරමින් බලාත්මකව තිබෙන බදු අනුපාත පදනම් කරගෙන, විලම්බිත බදු වත්කම් උපලබ්ධි කරගැනීමට හෝ බදු බැඳියාවන් නිරවුල් කිරීමට අපේක්ෂිත කාලය තුළ බදු ආදායමට (බදු පාඩුවට) අදාළ කර ගැනීමට අපේක්ෂා කරනු ලබන බදු අනුපාත මත විලම්බිත බද්ද ගණනය කෙරේ.

(ඇ) <u>වත්කම් හා තක්සේරු කිරීමේ පදනම</u>

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ප්‍රවර්තන වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇති වත්කම් වූ කලී සාමාගමේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය මුදල් බවට පත්කර ගැනීමට අපේක්ෂිත වත්කම් හෝ වාර්තා කිරීමේ දින සිට අවුරුද්දක් තුළ යන දෙකින් වඩාත් අඩු කාල සීමාවක් තුළ හඳුනා ගැනීමට තිබෙන ඒවා ය. ප්‍රවර්තන වත්කම් හැරුණු විට, වත්කම් යනුවෙන් දැක්වෙන්නේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දින සිට අවුරුද්දකට වඩා රඳවා ගැනීමට අපේක්ෂිත ඒවා ය.

## 3.3 <u>දේපල, පිරියත හා උපකරණ</u>

### (අ) හඳුනා ගැනීම හා ගණනය කිරීම

දේපල, පිරියත හා උපකරණ සඳහන් කරනු ලබන්නේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ප්‍රත්‍යාගණන වටිනාකම අනුව ඉදිරියට ගෙනගිය ඉඩම් හැර පිරිවැය අඩුකළ සමුච්චිත ක්ෂය වීම් හා කිසියම් සමුච්චිත හානිකරණ වටිනාකම් අනුව ය. ඓතිහාසික පිරිවැයට ඇතුළත් වන්නේ දේපල ඒවා පවතින ස්ථානයට රැගෙන ඒමේ දී කළමනාකාරිත්වය විසින් ඒවා තමන් අදහස් කරන ආකාරයට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තත්ත්වයන් යටතේ දැරීමට සිදු වූ යම් පිරිවැයක් වේ නම් ඒවා ද ඇතුළුව මූලිකව දැරූ පිරිවැය යි. තමන් විසින් ම ගොඩනගන ලද වත්කම්වල පිරිවැයට ද්‍රව්‍ය සඳහා වැය වූ පිරිවැය සහ සෘජු කම්කරු පිරිවැය ඇතුලත් වේ.

විවිධ ප්‍රයෝජ්‍ය ආයු කාලයක් සහිත ප්‍රධාන අංගවලින් යම් දේපලක්, පිරියත හෝ උපකරණ සමන්විත වේ නම් ඒවා වෙන්වෙන් දේපල, පිරියත හා උපකරණ සේ ගණන් ගනු ලැබේ.

**(ආ) අනුෂංගික වියදම්**

දේපල, පිරියත හා උපකරණයක ඉදිරියට ගෙනයන වටිනාකමට එවැනි භාණ්ඩයක කොටසක් වෙනුවට යමක් ප්‍රතිස්ථාපනය කිරීමේ දී ඊට වැය වෙන පිරිවැය ඇතුළත් කරන්නේ එයින් සමාගමට වර්ධනාත්මක ප්‍රතිලාභයක් අත්වන බව අපේක්ෂා කරන විට දී ය. ප්‍රතිස්ථාපනය කළ කොටසේ ඉදිරියට ගෙනයන වටිනාකම හඳුනා නොගැනේ. අනෙකුත් සියලු අලුත්වැඩියා කිරීම් සහ නඩත්තු සඳහා දැරූ වියදම් ඒවා දරන ලද කාල සීමාවේ ලාභයට හෝ පාඩුවට අයපත් කෙරේ.

(ඇ) __ක්ෂය වීම්__

ඉඩම් ක්ෂය වීම් ගණනය නොකරනු ලැබේ. ක්ෂය වීම් ලාභයට හෝ පාඩුවට අයපත් කෙරෙන්නේ අනෙකුත් දේපල, පිරියත හා උපකරණවල ඇස්තමේන්තු කළ ප්‍රයෝජ්‍ය ආයු කාලයක් එකී විෂයන්හි අවශිෂ්ඨ අගයෙන් අඩුකොට වත්කම්වල පිරිවැයට ඉඩදීම සඳහා ය. මීට සරල මාර්ග ක්‍රමය භාවිතා කෙරේ. දේපලවල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය පහත දැක්වේ.

| __වත්කම්__ | __වර්ෂ__ |
|---|---|
| ගොඩනැඟිලි | 20 |
| නාවික යාත්‍රා | 25 |
| මෝටර් රථ | 04-10 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 10 |
| කාර්යාලීය උපකරණ හා පරිගණක | 05 |

කිසියම් භාණ්ඩයක ක්ෂය වීම් ගණනය කිරීම ආරම්භ වන්නේ එය භාවිතයට ගත හැකි වූ විට වන අතර අනතුරුව විකිණීමට ඇති භාණ්ඩයක් සේ වර්ගීකරණය කළ දින සිට සහ එය හඳුනා නොගත් දිනට පෙර නතර වේ. වාර්තා කිරීමේ අවසාන දිනය වන විට කැපී පෙනෙන වෙනසක ඉඟියක් වේ නම් යෝග්‍යය යි සැලකෙන පරිදි වත්කමේ අවශේෂ වටිනාකම් ප්‍රයෝජ්‍ය ආයු කාල සහ ක්ෂය කිරීමේ ක්‍රම භාවිතමය අයුරින් සමාලෝචනය කොට ගැලපුම් කරනු ලැබේ.

සුදුස්සක් කොට බැහැර කිරීමේ දී විකුණු භාණ්ඩ විෂයේ ශුද්ධ නියාදන ලැබීම් සහ ඉදිරියට ගෙනයන වටිනාකම ලාභ හෝ පාඩු තුළ හඳුනා ගැනෙන අතර 'වෙනත් අදායම්' හෝ 'වෙනත් මෙහෙයුම් වියදම්වල' ඇතුළත් කෙරේ.

### 3.4 අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කරගන්න ලද පරිගණක මෘදුකාංග පාවිච්චියට සරිලන අයුරු විශේෂිත මෘදුකාංග හා ක්‍රම පද්ධති පිහිටුවීම සඳහා දරන ලද පිරිවැය පදනම් කරගෙන ඒවා ප්‍රග්ධනීකරණය කෙරේ . අත්පත් කරගත් එවැනි වත්කම් සම්බන්ධයෙන් ගත් කල ඒවායේ පිරිවැය සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානි පාඩු අඩු කිරීමෙන් පසුව සඳහන් කෙරේ . මෙකී පිරිවැය ඒවායේ ප්‍රයෝජ්‍ය ආයු කාලය අනුව පහත සඳහන් පරිදි ක්‍රමක්ෂය කෙරේ.

| | |
|---|---|
| පරිගණක මෘදුකාංග | අවුරුදු 05 |

පරිගණක මෘදුකාංග නඩත්තු කිරීමේ සේවාවන් ආශ්‍රිත පිරිවැය, දැරූ වියදමක් ලෙස හඳුනාගැනේ.

### 3.5 ආශ්‍රිත සමාගම්වල ආයෝජනය කිරීම

සාමාන්‍යයෙන් ඍජුව හෝ වක්‍රව 20% ක කොටස් ධාරිත්වයක් වෙනුවෙන් ජන්දය ප්‍රකාශ කිරීමේ හිමිකම ඇති එමෙන් සමාගම විසින් සැලකිය යුතු බලපෑමක් කළ හැකි. එහෙත් පාලනයක් (Control) කළ නොහැකි ආයතන, ආශ්‍රිත සමාගම් වේ. ආශ්‍රිත සමාගම්වල කෙරෙන ආයෝජන ගණනය කිරීම සඳහා ස්කන්ධ ගිණුම් ක්‍රමය භාවිතා කරන ලදී. මෙම ක්‍රමය යටතේ ආයෝජන මුලික වශයෙන් පිරිවැය මත හඳුනා ගනු ලැබේ. ආයෝජකයාගේ ලාභයේ හෝ පාඩුවේ කොටස හඳුනා ගැනීමට ඉදිරියට ගෙනයන වටිනාකම අත්පත්කර ගැනීමේ දිනෙන් පසුව වැඩි හෝ අඩු කෙරේ.

සමාගමේ පශ්චාත් අත්පත් කර ගැනීම්වල ලාභයේ හෝ පාඩුවේ කොටස විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනෙන අතර ආයෝජිතයාගේ සෙසු විස්තීරණ ආදායම තුළ එහි පශ්චාත් අත්පත් කර ගැනීම්වල චර්යාවන් ආයෝජකගේ ඉදිරියට ගෙනයන වටිනාකමට වූ අනුරූප ගැලපුම් සහිතව වෙනත් විස්තීරණ ආදායම් තුළ හඳුනා ගනු ලැබේ.

එක් එක් වාර්තා කිරීමේ දිනයේදී ආශ්‍රිත සමාගම්වල සිදුකර තිබෙන ආයෝජන හානිකරණ වී ඇත්ද යන්න පිළිබඳව කිසියම් විෂය මුලික සාක්ෂි තිබේදැයි යන්න සමාගම් විසින් තීරණය කරනු ඇත. එවන් අවස්ථාවක් වේ නම් ආශ්‍රිත සමාගම්වලින් අයකර ගත හැකි මුදල් ප්‍රමාණය හා එහි ඉදිරියට ගෙනයන වටිනාකම අතර වෙනස හානිකරණ සේ ගණනය කොට විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ ආශ්‍රිත සමාගම්වල ලාභයේ/ (පාඩුවේ) කොටසට සමීප සංඛ්‍යාව හඳුනා ගනු ලැබේ.

### 3.6 විකිණීමට තිබෙන ජංගම නොවන වත්කම්

ජංගම නොවන වත්කම් පාවිච්චි කිරීමට වඩා ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම් ඒවා මුලික වශයෙන් විකිණීමෙන් ලබා ගත හැකි වන්නේ නම් සමාගම විසින් ඒවා ජංගම නොවන වත්කම් වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ.විකිණීමට තිබෙන ජංගම වත්කම් මනිනු ලබන්නේ ඒවා විකිණීමට වැය වන පිරිවැය අඩුකිරීමෙන් පසු ඒවායේ ඉදිරියට ගෙන යන වටිනාකම සහ සාධාරණ අගය අනුවය. විකිණීම තිබෙන යන වර්ගීකරණය සඳහා වූ නිර්ණායකය සපුරා ඇති බව සැලකෙන්නේ විකිණීම අතිශය සම්භාවිත එකක් විම සහ වත්කම් පවතින ස්භාවයේ වහා විකිණීම සඳහා පැවතීම යන කරුණුය. කළමනාකාරීත්වය විසින් විකිණීමේ ක්‍රියාව සඳහා කැපවිය යුතු අතර විකිණීම සඳහා වර්ගීකරණය සිදුකොට වර්ෂයක් තුළදී එය අංග සම්පූර්ණ විකුණුම් ක්‍රියාවක් ලෙස හඳුනා ගැනීමට සුදුසුකම් ලබා තිබිය යුතුය.

අයිතිකරුවන්ට විකිණීමට/ බෙදා දීමට යනුවෙන් වර්ගකොට ඇති දේපල, පිරියත හා උපකරණ සඳහා ක්ෂයවීම හෝ ක්‍රමක්ෂය සිදු නොකෙරේ.

## 3.7 මූල්‍ය නොවන වත්කම් හානිකරණය වීම

එක් එක් වාර්තා කිරීමේ අවසන් දිනයට මූල්‍ය වත්කම් වල කිසියම් හානිකරණය වීමක් සිදුවී ඇත්දැයි යන්න හඳුනා ගැනීම පිණිස සමාගම විසින් ඒවා සමාලෝචනය කරයි. එවැනි හානිකරණය වීමක් සිදුවිය හැකි බවට ඉඟියක් වේ නම් එවැන්නක් සිදුවී ඇති වත්කමින් (හෝ අශ්‍රිත භාණ්ඩ සමුහයක්) අයකරගත හැකි මුදල ඇස්තමේන්තු කොට එහි ඉදිරියට ගෙනයන වටිනාකම, සමඟ සසඳනු ලැබේ.අය කර ගත හැකි මුදල අඩු නම් ඉදිරියට ගෙන යන වටිනාකම එහි ඇස්තමේන්තු කළ අයකර ගත හැකි මුදලට අඩුකොට, හානිකරණය පාඩුව ලාභ හෝ පාඩු තුළ ඉක්බිතිව හඳුනා ගැනේ.

මීට සමානව සෑම වර්තා කිරීමේ දිනය වන විට එක් එක් තොග (හෝ භාණ්ඩ සමුහය) ඒවායේ විකිණුම් මිල සමග,(සැසඳීම හා විකිණීම සඳහා දරන ලද පිරිවැය අඩුකොට), ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම සමග සසඳමින් හානිකරණ වීම් සැලකිල්ලට ගෙන තක්සේරු කරනු ලැබේ.

කිසියම් තොගයක් (හෝ එවැනි භාණ්ඩ සමුහයක්) හානිකරණ වී ඇත්නම් විකිණීමේ පිරිවැය අඩුකොට , එහි ඉදිරියට ගෙනයන වටිනාකම විකිණීමේ මිලට අඩු කරනු ලබන අතර ඉන් ඉක්බිතිව ලාභ හෝ පාඩු තුල හඳුනා ගැනීමට කටයුතු කෙරේ.

හානිකරණ පාඩුවක් ඉන් පසුව ප්‍රතිවර්තනය වේ නම් , වත්කමේ (හෝ ආශ්‍රිත වත්කම් සමුහයේ) ඉදිරියට ගෙනයන වටිනාකම එහි අයකරගත හැකි සංශෝධිත වටිනාකමට (තොගය සම්බන්ධයෙන් නම් ඒවා සම්පුර්ණයෙන් විකුණා දැමීමේ පිරිවැය අඩුකොට) ඉහල නංවනු ලැබේ . එහෙත් එය ඉකුත් අවුරුදු වල , එකී වත්කම (හෝ ආශ්‍රිතව වත්කම් සමුහය) සම්බන්ධයෙන් හානිකරණ පාඩුවක් සිදු නොවූ අවස්ථාවක තීරණය කිරීමට ඉඩ තිබු වටිනාකමට වැඩි නොවිය යුතු ය . හානිකරණ පාඩුවක ප්‍රතිවර්තනය ලාභ හෝ පාඩු තුල ඉක්බිතිව හඳුනා ගැනේ .

## 3.8 තොගය

තොග අගය, කරනු ලබන්නේ යල්පැන ගිය සහ අඩුවෙන් පාවිච්චි වන භාණ්ඩ විෂයන් වෙනුවෙන් ශුද්ධ ප්‍රතිලාභ සැලසීමෙන් පසු පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි වටිනාකම, හඳුනාගතහැකි වටිනාකම අනුව අගයනු ලැබේ. තොගවලට පරිභෝජන ද්‍රව්‍ය ඇතුලත් වේ.තොගය දැනට පවත්නා ස්ථානයට හා දැනට පවත්නා තත්වයට ගෙන ඒමට දැරූ පිරිවැය FIFO පදනම අනුව ගණනය කරනු ලැබේ.

මුදල් කිරීමේදි ලැබෙන ශුද්ධ වටිනාකම, සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු තුළ තොග භාණ්ඩ විකිණිය හැකි මිලයි.

## 3.9 මූල්‍ය උපකරණ

**මූල්‍ය වත්කම්**

සමාගම විසින් තම මූල්‍ය වත්කම් , ප්‍රාරම්භක හඳුනාගැනීම මත වර්ගීකරණය කිරීමට තීරණය කරනු ලබන අතර එකී මුල්‍ය වත්කම් පහත දැක්වෙන අයුරු වර්ග කරයි .

**(අ ) වර්ගීකරණය**

**(i ) ණය සහ ලැබිය යුතු දේ**

ණය සහ ලැබිය යුතු දේ යනු සක්‍රිය වෙළඳපොලේ ලයිස්තුගත නොවූ ස්ථිර හෝ නිර්ණය කල හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය . වාර්තා කිරීමේ දිනය අවසාන වීමේ සිට මාස 12 කට වඩා වැඩි කාල සීමාවක් සඳහා ප්‍රවර්තන නොවන වත්කම් සේ වර්ග කොට ඇති කල්පිරීම් ආයෝජන හැර ණය සහ ලැබිය යුතු දේ ප්‍රවර්තන වත්කම්වල ඇතුළත් කෙරේ.

සමාගම් ණය සහ ලැබිය යුතු දේ වලට අඩංගු වන්නේ වාර්තා කිරීම් කාල සීමාවේ අවසාන දිනය වන විට ඇති වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත , කාලීන තැන්පතු ආයෝජන, තැන්පතු හා අත්තිකාරම් , මුදල් හා මුදල්වලට සාමාන්‍යය දෑ යන ඒවාය

**(ii ) විකිනීමට ඇති මූල්‍ය වත්කම් (AFS)**

විකිනීමට ඇති මූල්‍ය වත්කම් වූ කලි මෙම ගණය යටතේ නම් කරන ලද ව්‍යුත්පන්න නොවන භාණ්ඩ විෂයන් හෝ වෙනත් ගණයන් යටතේ වර්ගීකරණය නොකරන ලද ඒවා වේ. වාර්තා කිරීමේ අවසන් දිනයේ සිට මස 12 ක් ඇතුලත විකුණා දැමීමට සමාගම අපේක්ෂා නොකරන්නේ නම් හෝ ආයෝජනය කල් නොපිරේ නම් එකී වත්කම් ප්‍රවර්තන නොවන වත්කම් වලට ඇතුලත් කෙරේ. විකිනීමට ඇති මූල්‍ය වත්කම්, දිගු කාලින ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොවූ කොටස් ආයෝජන වලින් සමන්විත වේ .

**(iii ) කල්පිරීම් සඳහා තබා ඇති ආයෝජන (HTM)**

කල්පිරීම් ආයෝජන වූ කලි ස්ථිර හෝ නිගමනය කල හැකි ගෙවීම් හා ස්ථිර කල්පිරීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන අතර ණය හා ලැබීම නියමිත ඊට ඇතුලත් නැත. කල්පිරෙන තෙක් එකී ආයෝජන එසේ රඳවා තැබීමට අපේක්ෂාවක් හෝ හැකියාවක් තිබේ නම් එම අයෝජන කල් පිරීම සඳහා රඳවා තැබූ ආයෝජන සේ වර්ග කෙරේ. අවුරුද්දකට වැඩි කාලයකින් කල් නොපිරේ නම් කල්පිරිම සඳහා රැඳවූ ආයෝජන ප්‍රවර්තන වත්කම් වලට ඇතුලත් කෙරේ. කල් පිරීම සඳහා තබා ඇති ආයෝජන භාණ්ඩාගාර බිල්පත් වලින් සමන්විත වේ.

**(ආ ) හඳුනාගැනීම හා ප්‍රාරම්භක මැන බැලීම්**

සමාගම විසින් ගණුදෙනු ආරම්භ කරන දිනයේ සිට ණය සහ අනෙකුත් ලැබීම් නියමිත වශයෙන් මූල්‍ය වත්කම් හඳුනාගැනේ. මූල්‍ය උපකරණ කොන්ත්‍රාත්තුමය විධිවිධාන තුළ සමාගම පාර්ශවයක් වන දිනයේ සිට (trade-date) අනෙකුත් මූල්‍ය වත්කම් හඳුනා ගනු ලැබේ. මූලික වශයෙන්ම මූල්‍ය වත්කමක් සාධාරණ මිල අනුව මනිනු ලබන අතර ඊට ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම අනුව හඳුනාගනු නොලබන වත්කම් සම්බන්ධයෙන් ඒවාට අදාළවන ඍජු ගණුදෙනු පිරිවැයද ඊට ඇතුළත්ය. මූල්‍ය වත්කමෙන් ජනිත වන මුදල් ප්‍රවාහයන් ලබා ගැනීමට තිබෙන හිමිකම් ඉකුත්වන විට හෝ එකී හිමිකම් වෙනත් පාර්ශවයකට පවරන විට සහ සමාගම සත්‍ය වශයෙන්ම පවරා දෙනු ලබන විට මූල්‍ය වත්කම් ප්‍රතිපාදන හඳුනා ගැනීමක් සිදු නොකෙරේ.

**(ඇ ) පසුව ගණනය කිරීම**

**(i) ණය සහ ලැබිය යුතු දේ**

ප්‍රාරම්භක හඳුනා ගැනීමෙන් ඉක්බිතිව ණය සහ ලැබිය යුතු දේ සඵල පොළී අනුපාත ක්‍රමය යොදා ගනිමින් හානිකරණ සඳහා වූ ප්‍රතිපාදන අඩුකොට ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලැබේ.

**(ii) විකිණිමට ඇති මූල්‍ය වත්කම්**

ප්‍රාරම්භක හඳුනාගැනීමෙන් ඉක්බිතිව, විකිණිමට ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ගකොට ඇති ලැයිස්තුගත කොටස් ආයෝජන සාධාරණ වටිනාකම අනුව මනිනු ලැබේ. විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ වටිනාකමෙහි වෙනස්කම් අනෙකුත් විස්තීරණ ආදායම්

තුළ හඳුනා ගැනෙන අතර කොටස් ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය තුළ විකිණීමට ඇති සංචිතය වශයෙන් ඉදිරිපත් කෙරේ. ලැයිස්තුගත නොවූ කොටස් ආයෝජන ප්‍රවර්තන කාළයේදී විශ්වාසදායි අයුරින් ඒවායේ සාධාරණ අගය තක්සේරු කල නොහැකි බැවින් හානිකරණය පාඩු කිසිවක් වේ නම් ඒවාද අඩුකොට පිරිවැය අනුව ගණනය කරනු ලැබේ.

**(iii ) කල්පිරිම සඳහා ඇති ආයෝජන**

කල්පිරීම් සඳහා තබා ඇති ආයෝජන සඵල පොලි අනුපාතය භාවිත කරමින් ක්‍රමක්ෂය පිරිවැය අනුව ගණනය කෙරේ. අත්පත් කරගැනීම් හා ගනුදෙනු පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ.

## (ඇ) මූල්‍ය වත්කම් හානිකරණය

### (i) ක්‍රමක්ෂය පිරිවැය අනුව ඉදිරියට ගෙන යන වත්කම්

එක් එක් වාර්තා කිරිමේ කාලසීමාව අවසානයේදී කිසියම් මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇති බවට විෂය මුලික සාක්ෂි තිබේදැයි තක්සේරු කරනු ලැබේ.

මූල්‍ය වත්කම් හානිකරණය වී හානිකරණ පාඩුවක් සිදුවන්නේ වත්කමේ ප්‍රාරම්භක හඳුනා ගැනිමෙන් ඉක්බිතිව සිදුවන්නා වූ යම් පාඩු සිදුවීමක් හෝ පාඩු සිදුවීම් ගණනාවක් නිසා වූ හානිකරණය වීමක් පිළිබඳව විෂය මුලික සාක්ෂි තිබේ නම් සහ එකී පාඩු සිදුවීම/ සිදුවීම් හරහා නිසැක ලෙස තක්සේරු කළ හැකි අනාගත මුදල් ප්‍රවාහයන් මත බලපෑමක් එයින් ඇති වන බවට විෂය මුලික සාක්ෂි ඇත්නම් පමණි.

ක්‍රමක්ෂය පිරිවැය අනුව ඉදිරියට ගෙනයන ණය හා ලැබිය යුතු දේ සම්බන්ධයෙන් ගත් කළ ඒවායේ පාඩු මනිනු ලබන්නේ වත්කමේ ඉදිරියට ගෙනයනු ලබන වටිනාකම සහ මූල්‍ය වත්කමේ වත්කම් සඵල පොලී අනුපාතය අනුව වට්ටම් කරන ලද ඇස්තමේන්තු අනාගත මුදල් ප්‍රවාහයන්හි (නොදැරූ අනාගත ණය පාඩු හැර) ප්‍රවර්තන අගය අතර ඇති වෙනසයි. මූල්‍ය වත්කමේ ඉදිරියට ගෙන ඇති වටිනාකම අඩු කරනු ලබන අතර පාඩු වූ මුදල විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ. ඉක්බිතිව එළඹෙන කාල පරිච්ඡේදයකදී හානිකරණ පාඩුව අඩු වේ නම් හා හානිකරණය හඳුනා ගැනිමෙන් පසුව සිදුවූ කාරණාවකට එකී අඩුවීම විෂය මුලික වශයෙන් සම්බන්ධතාවක් දක්වයි නම් කලින් හඳුනාගත් හානිකරණ පාඩුවේ වෙනස්වීම් විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ. එවැනි අපචය පාඩු ප්‍රතිවර්තනය නොකෙරේ.

### ii) විකිණීමට ඇති මූල්‍ය වත්කම්

වාර්තා කිරීම් අවසන් දිනය වන විට කැපීපෙනෙන අයුරින් දිගින් දිගටම හානිකරණය වී ඇති බවට විෂය මූලික සාක්ෂි ඇත්දැයි සමාගම විසින් තක්සේරු කරනු ලැබේ . ලැයිස්තු ගත කොටස් ආයෝජනය කිරීම් සම්බන්ධයෙන් ගත්කල ආයෝජනයන්හි සාධාරණ අගය ඒවායේ පිරිවැයට අඩු නම්,වත්කම් හානිකරණය වන බවට සාක්ෂියක් වේ . ලැයිස්තුගත ආයෝජන සම්බන්ධයෙන් එවැනි සාක්ෂියක් විද්‍යාමාන වේ නම් (ලාභ හෝ අලාභයන්හි කලින් හඳුනාගත් හානිකරණ පාඩු වේ දක්නට ලැබේ නම් ඒවා අඩුකොට ) අත්පත් කරගැනීමේ පිරිවැය හා වත්මන් සාධාරණ අගය අතර වෙනස සමුච්චිත අලාභය සේ ගණනය කරනු ලබන අතර ප්‍රතිවර්ගීකරන ගැලපුම් වශයෙන් කොටස් ස්කන්ධයේ

සිට ලාභය දක්වා හෝ පාඩු තුල හඳුනාගනු ලබන හානිකරණ පාඩු හෝ ලාභ හරහා ප්‍රතිවර්තනය කරනු ලැබේ . එසේ ප්‍රතිවර්තනය කරන ලද මුදල් ප්‍රමාණය වෙනත් විස්තීර්ණ අදායම් තුල හඳුනා ගනු ලැබේ .

ලැයිස්තුගත නොවූ කොටස් ආයෝජන සම්බන්ධයෙන් ගත්කල ආයෝජනයන්හි වටිනාකම ඒවා සඳහා දැරූ පිරිවැයට අනුව කැපී පෙනෙන අයුරින් දිගින් දිගටම අඩුවක් පෙන්නුම් කරන්නේ නම් එය වත්කම් හානිකරණය වන බවට සාක්ෂියක් වේ . එබඳු යම් සාක්ෂියක් ලැයිස්තුගත නොවූ ආයෝජන සම්බන්ධයෙන් දක්නට ලැබේ නම් එවැනිම මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන් වත්මන් වෙළඳපොලේ අනුප්‍රමාන (rate) මත වට්ටම් කරනු ලැබූ ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයන්හි වත්මන් වටිනාකම හා මූල්‍ය වත්කමේ ඉදිරියට ගෙනයන වටිනාකම අතර වෙනස පාඩුවට අදාල මුදල සේ ගණනය කරනු ලැබේ .

### 3.9.1 වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දේ

වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දේ, මූලිකව ගනුදෙනු මිල අනුව හඳුනා ගනු ලැබේ. ලැබිය යුතු දේ පොලියක් නොදරන විට සහ ලැබිය යුතු මුදල් (වට්ටම් නොකළ ) පදනම් කරගෙන තක්සේරු කරන තැන් හි දී සාමාන්‍ය ණය කොන්දේසි යටතේ බොහෝ විකිණුම් සිදු කෙරේ. සාමාන්‍ය ණය කාලසීමාවෙන් ඔබ්බට ණය දිගු කෙරෙන විට ලැබිය යුතු දේ, ක්‍රමක්ෂය පිරිවැය අනුව මැන බලන අතර ඊට යොදාගනු ලබන්නේ සඵල පොලි අනුපාතයයි. වාර්තා කිරීමේ අවසාන දිනයට වෙළඳ ලැබිය යුතු දේ ඉදිරියට ගෙනයන වටිනාකම (ලැබිය යුතු මුදල් ප්‍රමාණයෙන් ආපසු අය කර ගැනීමට නොහැකි වන බවට විෂය මූලික සාක්ෂියක් තිබේ දැයි තීරණය කිරීම පිණිස) සමාලෝචනය කරනු ලැබේ. එසේවන අවස්ථාවලදී හානිකරණ පාඩුව ලාභ සහ අලාභය වහාම හඳුනා ගැනේ.

### 3.9.2 මුදල් හා මුදල් සාමාන්‍යයන්

මුදල් හා මුදල් සාමාන්‍යයන්ට ඇතුලත් වන්නේ අතැති මුදල්, ඉල්ලූ විටෙක ගතහැකි තැන්පතු සහ මූලිකව මාස තුනකට වඩා හෝ ඊට අඩු කල්පිරීම් සහිත ඉහල ද්‍රවශීලතාවයෙන් යුක්ත අනෙකුත් කෙටි කාලීන ආයෝජනයන්ය. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල ඇති ප්‍රවර්තන වගකීම්වල බැංකු අයිරා සඳහන් කරනු ලැබේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය “වක්‍ර ක්‍රම” භාවිතා කරමින් පිළියෙළ කොට තිබේ.

**මූල්‍ය වගකීම**

### 3.9.3. වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දේ

වෙළඳ හා ගෙවිය යුතු දේ මූලික වශයෙන් ගනුදෙනු පිරිවැය ඇතුලත්ව ගනුදෙනු මිල යටතේ හඳුනාගනු ලැබේ. වෙළඳ ගෙවිය යුතු දේ වූ කලී සාමාන්‍ය ණය නියමයන් මත ඉටු කරන බැඳියාවන් වන අතර ඒවාට පොලිය අඩංගු නොවේ. සඵල පොලි අනුපාත ක්‍රමය යොදා ගනිමින් ඉක්බිතිව පොලි සහිත වගකීම් ක්‍රමක්ෂය පිරිවැය අනුව මැන බැලීම සිදු කෙරේ .

### 3.9.4 බැංකු අයිරා

බැංකු අයිරා, ඉල්ලු විටක ගෙවිය යුතු ඒවා වන අතර මුලිකව මැන බලා ඉක්බිතිව මුහුණත වටිනාකම අනුව සඳහන් කරනු ලැබේ.

### 3.10 රජයේ ප්‍රධාන

ප්‍රධාන ලැබෙන බවට සැලකිය යුතු සහතිකයක් තිබේ නම් සහ සමාගම විසින් ඊට අදාල කොන්දේසි වලට අනුව කටයුතු කරන්නේ නම් මුදල් නොවන ප්‍රදාන ඇතුළුව රජයෙන් ලැබෙන දෑ සාධාරණ මිල අනුව හඳුනාගැනේ .

දේපල , පිරියත හා උපකරණ සම්බන්ධයෙන් රජයෙන් ලැබෙන ප්‍රදාන විලම්භිත ප්‍රධාන ලෙසින් ජංගම නොවන වගකීම් වල ඇතුලත් කෙරෙන අතර අදාල වත්කම්වල අපේක්ෂිත ආයු කාලය මත සරල මාර්ග ක්‍රමයට විස්තීරණ අදායම් ප්‍රකාශය තුල හඳුනාගැනේ .

මුදල් නොවන ප්‍රදාන ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම අනුව අගයනු ලබන අතර ඉදිරියට ගෙනයන වටිනාකම අනුව ප්‍රදාන හා වත්කම් ලෙස ගිණුම් ගත කෙරේ.

**වගකීම් සහ ප්‍රතිපාදන**

මුල්‍ය තත්ත්ව ප්‍රකාශ තුල "ජංගම වගකීම්" ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇති බැඳියාවන් වූ කලී වාර්තා කිරීමේ දින සිට වර්ෂයක් ඇතුලත ගෙවිය යුතු දේ හෝ ඉල්ලු විටක ගෙවීමට තිබෙන ශේෂයන්ය.ජංගම නොවන වගකීම් යනු වාර්ථා කරන දිනයේ සිට වසරකට වඩා වැඩි බැඳීම් වේ.

මෙකී මුල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේදී , දන්නා ලද සියලු බැඳියාවන් ගිණුම්ගත කරනු ලැබ තිබේ. පසුගිය සිද්ධි වල ප්‍රතිඵලයක් වශයෙන් සමාගමට සාධනීය බැඳියාවන් හෝ නෛතික බැඳියාවන් ඇති විට ප්‍රතිපාදන හා බැඳියාවන් හඳුනාගනු ලැබෙන අතර බැඳියාවන් ඉටුකිරීම වෙනුවෙන් ඇතැම්විට ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලනය වීමක් ඇතිවිය හැක .

### 3.11 විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය

සමාගම සතුව නිශ්චිත ප්‍රතිලාභ මෙන්ම නිශ්චිත දායකත්ව සැලැස්ම යනුවෙන් විශ්‍රාම සැලැස්මක් තිබෙන අතර වෙනම ආයතනයක් සඳහා සමාගම නිශ්චිත දායකත්වයක් සිදුකරයි. එහෙත් සමාගම සතුව ප්‍රමාණවත් අරමුදල්, ප්‍රවර්තන හා පෙර කාල සීමා වෙනුවන් සේවකයින්ගේ සේවා වෙනුවෙන් ප්‍රතිලාභ ගෙවීමට නොමැති විට ඒ සඳහා සම්මුතික හා නෛතික වශයෙන් සමාගම වගකීමෙන් බැඳී නැත .

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම විශ්‍රාම සැලසුමක් වන අතර නිශ්චිත දායකත්ව සැලසුමක් නොවේ. සාමාන්‍ය පරිදි විශ්‍රාම යාමේදී සේවකයෙකුට ලැබෙන නිශ්චිත මුදල කුමක්දැයි නිශ්චිත ප්‍රතිලාභ අරමුදලින් හැඳින්වේ . එය වයස , සේවා කාලය හා වන්දි මුදල මත තීරණය වේ .

**(අ ) නිශ්චිත දායකත්ව සැලසුම්** - සේවක අර්ථසාධක අරමුදල (E P F )
- සේවක භාර අරමුදල (E T F )
-

සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාර අරමුදලට සුදුසුකම් ලබන සියලු සේවකයින් ඒ ඒ ව්‍යවස්ථා සහ රෙගුලාසි අනුව අදාල දායකත්ව අරමුදල් වලින් ආවරණය වේ .

(ආ ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - විශ්‍රාම පාරිතෝෂික

විශ්‍රාම පාරිතෝෂික සම්බන්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල හඳුනාගෙන ගෙන ඇති වගකීම් වනාහි වාර්තා කිරීමේ දිනය වන විට පවතින පාරිතෝෂික බැඳියාවන්හි වටිනාකමයි. පාරිතෝෂික ගණනය කිරීමේ සූත්‍රයට අනුව ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය භාවිතා කරමින් පාරිතෝෂික බැඳියාවන් මනිනු ලැබේ .

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනතට අනුව අවුරුදු 05 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කොට විශ්‍රාම යන සේවකයින්ට පමණක් පාරිතෝෂික ගෙවීමට සමාගම බැඳී සිටී.

වෙනත් විස්තීරණ ආදායම් තුළ ජීව ගණක ලැබිය යුතු දේ/පාඩු ඒවා සිදුවූ කාල සීමාව අනුව හඳුනා ගැනේ.

පාරිතෝෂිකයට, බාහිර වශයෙන් මුදල් සම්පාදනය නොකෙරේ.

3.12 හදිසි අවස්ථා සහ ප්‍රාග්ධන බැඳියාවන්

වාර්තා කරන දිනය වන විට පවත්නා සියලුම ප්‍රමාණාත්මක බැඳියාවන් හා අවිනිශ්චිත වගකීම්, මූල්‍ය ප්‍රකාශන වල ඒ ඒ සටහන් වලින් හෙලිදරව් කෙරේ.

<u>විස්තීරණ ආදායම් ප්‍රකාශය</u>

3.13 ආදායම හඳුනාගැනීම

සමාගමට ආර්ථික ලැබිය යුතු දේ සහ දැරීමට ඇති ආදායම හා ආශ්‍රිත වියදම් විශ්වාසදායක ලෙස මැනිය හැකි විමසීම සම්භාවි වන තරමට ආදායම හඳුනාගැනේ. ලැබීමට ඇති හා ලැබූ ප්‍රතිෂ්ඨාවේ සාධාරණ මිල අනුව ආදායම මනිනු ලැබේ.

(අ) යාත්‍රා ආදායම

නැව් බඩු මෙහෙයුම් කටයුතු වලින් හා ප්‍රවාහන සේවා වලින් උත්පාදනය වන ආදායම, සේවාවන් සම්පූර්ණයෙන් ඉටුකිරිමේ පදනම මත ඒවා සපයන ලද කාල සීමා තුළදී හඳුනාගැනෙන අතර තථ්‍ය වශයෙන්ම සපයන ලද සේවා පදනම අනුව තක්සේරු කරනු ලැබේ.

(ආ) නැව්කුලී ආදායම

කාල පදනම මත නැව් කුලියට දීමෙන් ලැබෙන ආදායම කුලී ගිවිසුම් කාලය මත පදනම් කර ගෙන උපචිත පදනමෙන් හඳුනාගනු ලැබේ.

(ඇ) නියෝජිත ගාස්තු

සේවාවන් සම්පූර්ණ කිරීමේ පදනම මත සේවාවන් සැපයූ කාලය අනුව නියෝජ්‍ය ආයතන ගාස්තු හඳුනාගනු ලැබේ.

(ඇ) පොලිය

සඵල පොලී ක්‍රමය යොදාගනිමින් පොලී ආදායම හඳුනාගනු ලැබේ.

(ඉ) වෙනත් ලාභ හා අලාභ

ආයෝජන ඇතුලු දේපල, පිරියත හා උපකරණ හා අනෙකුත් ජංගම නොවන වත්කම් විකිණීමෙන් ලැබෙන ආදායම් ස්වභාවයේ ශුද්ධ ලැබිය යුතු දේ සහ පාඩු, ලාභ සහ පාඩු වෙනුවෙන් ගිණුම් ගත කෙරෙන්නේ ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම හා ආශ්‍රිත විකුණුම් වියදම් විකිණීමෙන් ලත් මුදලින් අඩුකිරීමෙන් ඉක්බිතිවය.

(ඊ) ලාභාංශ ආදායම

ගෙවීම් ලැබිය යුතු දේ සඳහා වූ අයිතිය තහවුරු වූ පසු ලාභාංශ ආදායම හඳුනාගනු ලැබේ.

## 3.14 වැය හඳුනාගැනීම

කාර්යක්ෂමව ව්‍යාපාරය පවත්වා ගැනීම සහ දේපල පිරියත උපකරණ නඩත්තු කිරීම සඳහා දැරූ සියලුම වියදම් වර්ෂය සඳහා වූ ලාභය හෝ පාඩුව ගණනය කිරීමේදී ආදායමට අයපත් කොට තිබේ.

## 3.15 ණයට ගැනුම් පිරිවැය

ණයට ගැනුම් පිරිවැය ඍජුවම අදාල වන්නේ වත්කමක් අත්පත් කර ගැනීම, එම වත්කමේ පිරිවැයේ කොටසක් වන සුදුසුකම් ලබන වත්කමක් ගොඩනැගීම හෝ නිෂ්පාදනය වෙනුවෙන් වූ පිරිවැයයි. අනෙකුත් ණයට ගැනුම් පිරිවැය වියදමක් ලෙස හඳුනා ගැනේ.

## 3.16 ආශ්‍රිත පාර්ශව සමග ගනුදෙනු

අයකරනු ලබන ගාස්තු පිළිබඳව තැකීමක් නොකොට මුල්‍ය හා මෙහෙයුම් තීරණ/ ප්‍රතිපත්ති මත කැපී පෙනෙන පාලනයක් හෝ බලපෑමක් ඇති කිරීම සඳහා එක් පාර්ශවයකට හැකියාව ලැබෙන ගනුදෙනු සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම් සිදුකොට තිබේ .

## 3.17 නිකුත් කරනු ලැබ ඇති එහෙත් තවමත් බලාත්මක නොවූ නව ගිණුම්කරණ ප්‍රමිතීන්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් ඉදිරියේදී බලාත්මක වීමට නියමිත පහත දැක්වෙන නව ගිණුම් ප්‍රමිතීන් 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේදී යොදා නොගන්නා ලදී.

SLFRF 9 - මූල්‍ය උපකරණ : වර්ගීකරණය හා ගණනය කිරීම

LKAS 39 හි නිර්වචනය කරනු ලැබ ඇති පරිදි මූල්‍ය වත්කම් හා බැරකම් වර්ගීකරණය හා ගණනය කිරීමේදී මෙම ප්‍රමිතීන් අදාළ වේ. මෙම ප්‍රමිතිය 2012 වර්ෂයේදී නිකුත් කරන ලදි. 2018/19 මුදල් වර්ෂයේ සිට ලංකා නැව් සංස්ථාව විසින් එය ක්‍රියාත්මක කරනු ලැබේ.

## SLRF 15 -ගණුදෙනුකරුවන් සමග වූ කොන්ත්‍රාත්වලින් ආදායම

ආදායම කොතරම් ප්‍රමාණයක් යන්න සහ කෙබඳු ආවස්ථාවකදී හඳුනාගන්නේද යන්න නීර්ණය කිරීම සඳහා වූ විස්තීරණ ක්‍රියාරාමුවක් මෙයින් ස්ථාපනය කෙරේ. LKAS 18 - ආදායම් LKAS 11 - ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සහ IFRIC 13 - ගනුදෙනුකරු නැඹුරු වැඩසටහන් ඇතුළුව දැනට පවත්නා ආදායම හඳුනා ගැනීමේදී මාර්ගෝපදේශ ප්‍රතිස්ථාපනය කරයි. මෙම ප්‍රමිතිය 2018/19 මූල්‍ය වර්ෂයේ සිට ලංකා නැව් සංස්ථාව විසින් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

සිදු කරන ලද ප්‍රාථමික විශ්ලේෂණය පදනම් කරගත් කල යථෝක්ත අයුරින් යොදාගන්න ලද ප්‍රමිතීන් තුලින් මුල්‍ය ප්‍රකාශ කෙරෙහි කිසිදු වැදගත් බලපෑමක් සිදුවෙතැයි අපේක්ෂා නොකෙරේ.

**සී/ස ලංකා නැව් සංස්ථාව**

**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

**මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | | සටහන | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|---|
| 4 | **ආදායම** | | | |
| | යාත්‍රා ආදායම | | 359,804,557 | 243,814,361 |
| | නැව් බඩු ප්‍රවාහනයෙන් ලැබූ ආදායම (ස්වකීය නාවික යාත්‍රා මගින්) | | 1,103,608,246 | 1,375,053,894 |
| | ගල් අඟුරු නැව් කුලියට දිමෙන් ආදායම | | - | 175,474,589 |
| | තමන්ගේම නාවික යාත්‍රා කුලියට දීමෙන් ආදායම | | 430,562,416 | 138,620,100 |
| | නිෂ්කාෂණ හා ඉදිරිපත් කිරීම් | | 138,032,457 | 51,717,196 |
| | නියෝජිත ගාස්තු ඇඩ්‍රස් කොමිස් | | 467,462,329 | 556,328,790 |
| | | | 2,499,470,005 | 2,541,008,930 |

| | | | | |
|---|---|---|---|---|
| 5 | **වෙනත් ආදායම්** | | | |
| | ස්ථාවර වත්කම් විකිණීමෙන් ලාභ | | 54,755 | 19,740,653 |
| | ලාභාංශ | | 52,636 | 46,191 |
| | ශුද්ධ විනිමය (පාඩු) ලැබිය යුතු දේ | | 62,647,290 | 16,949,910 |
| | පොලී ආදායම - ස්ථිර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත් | | 73,059,766 | 51,708,940 |
| | වෙනත් තැන්පතුවලින් පොලී ආදායම | | - | 9,166,710 |
| | පොලී ආදායම - (සේවක මණ්ඩලයට ණය දීමෙන්) | | 1,510,649 | 1,234,302 |
| | ප්‍රමාද ගාස්තු අයකර ගැනීම් - ස්වකීය යාත්‍රා | | 110,847,219 | 59,989,618 |
| | කළමණාකරණ ගාස්තු - ලං.වි.ම ටග් යාත්‍රා සහ බත්තල් | | 7,888,400 | 11,802,900 |
| | වෙනත් | | 647,174 | 12,340,336 |
| | | | 256,707,888 | 182,979,559 |

6 **මෙහෙයුම්වලින් ලාභ (පාඩු)**

පහත දැක්වෙන දෑ ඇතුළු වියදම් අයපත් කිරිමෙන් පසුව මෙහෙයුම් ලාභය (පාඩුව) සඳහන් කොට තිබේ

| | | |
|---|---|---|
| විගණකවරුන්ගේ පඩිනඩි | - | 56,000 |
| ක්ෂය වීම් | 417,268,522 | 34,766,522 |
| වෘත්තිය හා නෛතික ගාස්තු | 5,599,454 | 3,833,188 |
| කාර්ය මණ්ඩල පිරිවැය (සටහන 6.1) | 144,466,951 | 130,612,740 |

6.1 **කාර්ය මණ්ඩල පිරිවැය**

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂවරුන්ගේ වේතන | 288,600 | 400,800 |
| වැටුප් හා වේතන | 125,167,225 | 102,100,966 |
| නිශ්චිත දායකත්වය සැලසුම් පිරිවැය - (EPF)<br>- (ETF) | 13,372,987 | 11,205,512 |
| නිශ්චිත දායකත්වය පිරිවැය - විශ්‍රාම පාරිතෝෂික | 5,638,139 | 16,905,462 |
| | 144,466,951 | 130,612,740 |

| | සටහන | 2018 රු. | 2017 රු. |
|---|---|---|---|
| **7 මූල්‍ය වියදම්** | | | |
| **පොලී වියදම් - යාත්‍රා ණය** | | (767,082,249) | (651,923,689) |
| විණිමය පාඩු | | (294,313,679) | (501,927,566) |
| | | (1,061,395,928) | (1,153,851,255) |
| **8 ආදායම් බදු වලින් ආදායම/ (වියදම්)** | | | |
| සාමාන්‍ය කටයුතු සඳහා බදු | 8.1 | 12,214,634.00 | 7,281,062 |
| විලම්බිත බදු වත්කම් ප්‍රතිවර්තනය | 17 | (69,713,367.00) | (40,188,545) |
| උද්දේශික ලාභාංශ බද්ද | | - | - |
| | | (57,498,733) | (32,907,483) |

| | සටහන | 2018 | 2017 |
|---|---|---|---|
| **8.1 බද්දට යටත් ලාභය හා ගිණුම් ලාභය සැසඳීම** | | | |
| බද්දට පෙර ගිණුම් ලාභය | | (233,055,234) | (269,918,135) |
| අඩු කළා : ආශ්‍රිත සමාගම්වල ලාභයේ කොටස (බද්ද ඇතුළුව) | | (17,111,132) | (12,506,937) |
| | | (250,166,366) | (282,425,072) |
| ඉඩදිය නොහැකි විෂයාංග මුළු එකතුව | | 484,030,409 | 424,512,621 |
| ඉඩදිය හැකි විෂයාංග මුළු එකතුව | | (3,757,140,217) | (3,752,658,075) |
| බද්දට යටත් නැති ආදායම | | (74,623,051) | (62,156,143) |
| වෙළඳාම හෝ ව්‍යාපාරයෙන් ලාභ (පාඩු) | | (3,597,899,225) | (3,672,726,669) |
| **එකතු කළා** : බදුපොලී ආදායමට යටත් වෙනත් ආදායම් (රු.74,570,715 ක් 35% බැගින්) | | 26,099,645 | 21,738,483 |
| මුළු ව්‍යවස්ථාපිත ආදායම/ තක්සේරු ආදායම | | (3,571,799,580) | (3,650,988,186) |
| එකතු කළා : බද්දට යටතේ බදු පොලී ආදායම (රු.74,570,415.30 ක් 65% බැගින්) | | 48,470,770 | 40,371,469 |
| 28% ව්‍යවස්ථාපිත බදු අනුප්‍රමාණය අනුව අය කළ බද්ද | | 13,571,816 | 11,304,011 |
| 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 59H වගන්තිය අනුව 10% ක ආදායම් බදු සහනය | | (1,357,182) | (1,130,401) |
| වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද | | 12,214,634 | 10,173,610 |
| **අඩු කළා : කල්පිත බද්ද** | | - | (2,892,548) |
| **වර්ෂය සඳහා සාමාන්‍ය ක්‍රියාකාරකම් මත ප්‍රවර්තන බද්ද** | 8 | 12,214,634 | 7,281,062 |

## 9 කොටසක් වෙනුවෙන් මූලික හා තනුක ඉපැයීම්

කොටසක් වෙනුවෙන් වූ ඉපැයීම් ආගණනය කෙරෙනුයේ වාර්තා කිරීමේ කාලය තුළ නිකුත් කොට ඇති සාමාන්‍ය බර තැබූ මාධ්‍ය සංඛ්‍යාවෙන් සාමාන්‍ය කොටස් හිමියාට ආරෝපනය කළ හැකි ශුද්ධ ලාභයයි.

| | | |
|---|---|---|
| ***ලවය වශයෙන් භාවිතා කරන ලද මුදල*** | | |
| කොටස් හිමි ආරෝපිත ශුද්ධ ලාභය (රු) | (245,269,868) | (277,199,197) |
| ***හරය වශයෙන් භාවිතා කරන ලද මුදල*** | | |
| නිකුත් කොටස්වල බර තැබූ සාමාන්‍යය | 5,000,000 | 5,000,000 |
| කොටස් වෙනුවෙන් මූලික හා තනුක ඉපැයීම් (රු) | (49.05) | (55.44) |

### කොටසක් සඳහා මූලික හා තනුක ඉපැයීම්

වාර්තා කිරීමේ කාලය තුළ නිකුත් කරනු ලබන සාමාන්‍ය කොටස් ගණනේ සාමාන්‍ය බර තැබූ සාමාන්‍ය කොටස් ධාරීන් වෙත ආරෝපනය කළ හැකි ලාභය (පාඩුව) බෙදා ගණනය කිරීමෙන් මූලික හා තනුක ඉපැයීම් (පාඩු) කොටස් අනුව ගණනය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| ***ලවය වශයෙන් භාවිත මුදල*** | | |
| (රු.)කොටස්ධාරීන් වෙත අදාළ ශුද්ධලාභය(පාඩුව) | (245,269,868) | (277,199,197) |

| 10 දේපොල, පිරියත හා උපකරණ | ඉඩම් හා නිවාස ව්‍යාපෘති | ගොඩ නැගිලි | යාත්‍රා | මෝටර් වාහන | ගෘහ භාණ්ඩ හා සවිකුරු | කාර්යාලීය උපකරණ හා පරිගණක | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **පිරිවැය තක්සේරුව** | | | | | | | |
| 2017 අප්‍රේල් 1 ට ශේෂය | 5,286,340 | 43,390 | 11,235,780,363 | 30,929,955 | 15,676,410 | 21,029,053 | 11,308,745,511 |
| වර්ෂය තුළ එකතු කිරීම් | - | - | - | | 1,543,659 | 2,424,102 | 3,967,761 |
| ප්‍රාග්ධන කාර්යන්ගෙන් මාරු කිරීම් | - | - | | | | | |
| වර්ෂය තුළ ක්‍රියාත්මක යාත්‍රා | - | - | - | - | - | - | - |
| වර්ෂය තුළ බැහැර කිරීම් | - | - | | (176,940) | (610,610) | (802,647) | (1,590,197) |
| 2018 මාර්තු 31 දිනට ශේෂය | 5,286,340 | 43,390 | 11,235,780,363 | 30,753,.015 | 16,609,459 | 22,650,506 | 11,311,123,075 |
| **සමුච්චිත ක්ෂය වීම්** | | | | | | | |
| 2017 අප්‍රේල් 1 දිනට ශේෂය | 1,228,108 | 43,390 | 377,374,055 | 20,864,584 | 11,357,091 | 16,645,396 | 427,512,624 |
